ISSUE 01
2022 / AUGUST

www.facebook.com

www.twitter.com

www.youtube.com



# අලුත් ව්‍යවස්ථාවක අභියෝග

08

ලංකාවේ නිල නාමය ගැන පවා අලුතින් සිතිය යුතු මොහොතක්

- මහාචාර්ය ජයදේව උයන්ගොඩ

17

ව්‍යවස්ථාව සම්පාදනය විය යුත්තේ මහජන සහභාගිත්වයෙන්

- චරාන් වික්‍රමරත්න

සුරැකි හඬ ජනතාවගේ හඬ

VOICE OF CITIZENS

CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

21

පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයත් තහවුරු කළ යුතුයි

- ආචාර්ය හරිනි අමරසූරිය

26

පරණ ක්‍රමය පැත්තකින් තියලා අලුතෙන් සිතන්න ඕන

- එම්. ඒ. සුමන්තිරන්

2022 / AUGUST

ISSUE 01

**සංස්කරණය:**

ලයනල් ගුරුගේ
ජයසිරි ජයසේකර

**පිටු සැකසුම:**

නලින්ද සෙනෙවිරත්න

කවර ඡායාරූපය twitter.com/thrimaz
අනෙකුත් ඡායාරූප facebook.com


---

මෙම ප්‍රකාශනයේ අඩංගු ලිපි, ඒවායෙහි කතුවරුන් විසින් ප්‍රකාශ කර ඇති අදහස් ඔවුන්ගේ මතයන් වන අතර ඒවා තුළින් අත්‍යවශ්‍යයෙන්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස් පිළිබිඹු නොවේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

**ලිපිනය** : අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
**දුරකථන** : +94112081384, +94112081385, +94112081386
**ෆැක්ස්** : +94112081388
**විද්‍යුත් තැපැල** : info@cpalanka.org
**වෙබ් අඩවිය** : www.cpalanka.org
**මුහුණුපොත** : www.facebook.com/cpasl
**ට්විටර්** : @cpasl


# පටුන



**08**

**ලංකාවේ නිල නාමය ගැන පවා අලුතින් සිතිය යුතු මොහොතක්**

- මහාචාර්ය ජයදේව උයන්ගොඩ



**17**

**ව්‍යවස්ථාව සම්පාදනය විය යුත්තේ මහජන සහභාගිත්වයෙන්**

- චිරාන් වික්‍රමරත්න



**19**

**මැතිවරණ ක්‍රමයේත් වෙනසක් අවශ්‍යයි**

- දයාසිරි ජයසේකර



**21**

**පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයත් තහවුරු කළ යුතුයි**


- ආචාර්ය හරිනි අමරසූරිය



24

අරගලයට කොටු වෙලා ව්‍යවස්ථා හැදුවොත් රටට හෙණ ගැහුව වගේ තියේවි


- ප්‍රසන්න රණතුංග



26

පරණ ක්‍රමය පැත්තකින් තියලා අලුතෙන් සිතන්න ඕන

- එම්. ඒ. සුමන්තිරන්



28

ව්‍යවස්ථා සංශෝධනයක් ඉක්මනින් සම්මත කළ යුතුයි

- රාවුෆ් හකීම්



30

අලුත් ව්‍යවස්ථාවක් ගේන්න මේ පාර්ලිමේන්තුවට බැහැ

- මනෝ ගනේෂන්



**33**

**සංවර්ධනය සඳහාත් ව්‍යවස්ථාපිත තුලනයක් අවශ්‍යයි**

- පාඨලී චම්පික රණවක



**37**

**සීමා නිර්ණය ගැන විකල්ප යෝජනාවක්**


- මයිල්වාහනම් තිලකරාජා



**40**

**පූර්ණ ප්‍රතිසංස්කරණයක් වහාම අවශ්‍යයි**

- වීරසුමන වීරසිංහ



**45**

**අපේ යෝජනාව සහසන්ධීය ව්‍යවස්ථාවක්**

- විනිසුරු සී. වී. විග්නේශ්වරන්

# අරගලයේ සංඥා තේරුම් ගැනීම



'පුරවැසි හඬ' යනු මෙරට සාමාන්‍ය පුරවැසියන්ගේ හඬ සමාජගත කිරීමත්, පුරවැසියන්ට වැදගත් වන කරුණු පිළිබඳව පුළුල් සංවාදයක් ගොඩනැගීමත් අරමුණු කරගත් ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වසර 25ක් තිස්සේ ගොඩනැගූ සමාජ කතිකාව මේ මොහොතේ තවදුරටත් තීව්‍ර කළ යුතු යැයි අපි කල්පනා කළෙමු. ඒ අනුව මෙම ප්‍රකාශනය භාෂා තුනෙන්ම පළ කෙරෙන අතර, මෙම සංවාද සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ වීඩියෝ මාධ්‍යයෙන්ද පළ කිරීමට අදහස් කරමු.

ව්‍යවස්ථා සම්පාදනය රටක ඉතාම වැදගත් සාධකයකි. සෝල්බරි ව්‍යවස්ථාවේ සිට 78 ව්‍යවස්ථාව දක්වාත්, එතැන් සිට මේ දක්වාත් සිදු වූ කිසිදු ව්‍යවස්ථා සම්පාදන කාර්යයක් තුළ මේ සමාජයේ ජීවත්වන මිනිසුන්ගේ සැබෑ ජීවිත අභිලාෂයන් නියෝජනය නොවූ බව පැහැදිලිය. 71 කැරැල්ලෙන් ආ පණිවුඩය වටහාගත් බවක්, 72 ව්‍යවස්ථාවෙන් පිළිබිඹු නොවිණි. 20 වතාවක් සංශෝධනය වෙමින් වර්තමානය දක්වා ක්‍රියාත්මක වන 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, වසර 40කට අධික එම කාල පරාසය තුළ උතුරේ සහ දකුණේ කැරලි දෙකකින් අභියෝගයට ලක් කෙරිණි. පුරවැසියන් ලෙස තම අයිතිවාසිකම් ඉල්ලා සිටි උතුරේ ජනයාගේ ගැටලුව තිස් අවුරුදු යුද්ධයක් දක්වා වර්ධනය වන තුරුම ඊට සාධාරණ විසඳුමක් ලබා දීමට රාජ්‍යය අසමත් විය. යුද්ධයෙන් පසු දස වසරකට වැඩි කලක් ගෙවී ඇතත් තවමත් එම ගැටලුවලට විසඳුම් ලැබී නැත. 88-89 දකුණේ තරුණ කැරැල්ල විසින් මතු කළ සංඥා වටහා ගැනීමටද පාලකයින් අපොහොසත් විය. නිදහසින් පසුව ගෙවුණු වසර 75කට ආසන්න කාලය තුළ සමාජය වෙතින් පළ වූ එවැනි බරපතළ සංඥා කිසිවක් වටහා ගැනීමට කිසිදු පාලකයකු සමත් වී ඇති බවක් නොපෙනේ.

පහුගියදා පැනනැගුණු මහජන අරගලය, මෑත ඉතිහාසයේ ඉතාම කේන්ද්‍රීය අරගලයකි. එහි ඉතා සාධනීය අංග මෙන්ම ඇතැම් නිෂේධනීය අංගද තිබිණි. මෙහි සුවිශේෂත්වය වන්නේ, එය නිර්ප්‍රචණ්ඩ හා ඉතා නිර්මාණශීලී එකක් වීමයි. 71 සහ 88-89 තරුණ කැරලි යම් ප්‍රමාණයකට ආයුද සන්නද්ධ කැරලි විය. මේ අරගලයට දායක වූ තරුණ පිරිස 88-89 පරපුරේ

දරුවන් හා 71 පරපුරේ මුනුපුරු මිනිපිරියන් ලෙස සැලකිය හැකිය. ඔවුන්ගේ සටන් ක්‍රමය වුණේ මුළුමනින්ම අවිහිංසාවාදයයි. එමෙන්ම, ජාති, ආගම්, පන්ති, ග්‍රාමීය- නාගරික, ස්ත්‍රී- පුරුෂ ආදී බෙදීම්වලින් තොරව සියලු දෙනා ඒකරාශී කිරීමේ ශක්තියක් හා සියලු දෙනාට සමාන වටිනාකමක් ඒ අරගලය තුළ තිබිණි. එවැනි සාධනීය අංග ගණනාවක් එමගින් මතු කළේය. නමුත් මේ අරගලයෙන් පසුවත්, එහි සංඥාවන් වටහා නොගෙන පැරණි ක්‍රමයටම ඉදිරියට යෑමේ උත්සාහයක් රජය පාර්ශ්වයෙන් පළ වීම ඉතා කනගාටුදායකය.

**ඔවුන්ගේ සටන් ක්‍රමය වුණේ මුළුමනින්ම අවිහිංසාවාදයයි. එමෙන්ම, ජාති, ආගම්, පන්ති, ග්‍රාමීය- නාගරික, ස්ත්‍රී- පුරුෂ ආදී බෙදීම්වලින් තොරව සියලු දෙනා ඒකරාශී කිරීමේ ශක්තියක් හා සියලු දෙනාට සමාන වටිනාකමක් ඒ අරගලය තුළ තිබිණි.**

කැබිනට් මණ්ඩලය, අගමැතිවරයා හා අවසානයේ ජනාධිපතිවරයා දක්වා තනතුරු අත්හැර යෑමට හේතු වුණු වත්මන් අරගලය කෙරෙහි වෛරී ආකාරයකින් ප්‍රතිචාර දක්වමින් සිටින බව පැහැදිලිවම පෙනෙන්නට තිබේ. මෙය ඉතා නරක ප්‍රතිවිපාක ඇති කළ හැකි තත්ත්වයකි. මෙවැනි පසුබිමක් තුළ අපේ වෑයම, අරගලය විසින් මතු කළ 'ක්‍රමයේ වෙනසක් සිදු කිරීම' පිළිබඳ කාරණය සංවාදයකට ලක් කිරීමයි.

රටක ව්‍යවස්ථාව එරට පුරවැසියන් සියලුනාගේ ගෞරවයට හා පිළිගැනීමට හේතු වන්නක් විය යුතුය. එමෙන්ම ව්‍යවස්ථා සම්පාදන කාර්යයද ප්‍රභූ තන්ත්‍රයේ හෝ දේශපාලන පක්ෂවල හෝ කාර්යයක් බවට සීමා නොකොට, සමාජයේ විවිධ ස්ථර නියෝජනය කරන පරිස්වල සහභාගිත්වයෙන් හා පුළුල් සංවාදයක් ඔස්සේ සිදු කළ යුත්තකි. එය දින කිහිපයකින් සිදු කළ හැක්කක් නොවේ. ඒ පිළිබඳ එක් කෙටුම්පතක් නොව කෙටුම්පත් කිහිපයක් සම්පාදනය විය හැකි අතර අවසන් කෙටුම්පත මහජනයා අතර පුළුල් සංවාදයකට ලක් විය යුතුය. අපගේ වෑයම වන්නේ නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිළිබඳව එවැනි සංවාදයක් ගොඩනැගීමට දායක වීමයි.

එහි පළමු අදියර ලෙස, මේ වන විට ක්‍රියාකාරී දේශපාලනයේ නිරතව සිටින පක්ෂවල නායකයින් ඒ කෙරෙහි කොතෙක් දුරට සංවේදී වී ඇත්දැයි විමසා බැලුවෙමු. දේශපාලන ප්‍රතිසංස්කරණ ගැන ඔවුන් කල්පනා කරන්නේ කෙසේද යන කාරණයත්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය වැනි කාරණාත් සාකච්ඡා කළෙමු.


ඉදිරියේදී මෙවැනි විෂයයන් පිළිබඳව තවදුරටත් සංවාද ගොඩනැගීම අපේ බලාපොරොත්තුවයි. විශේෂයෙන් ඒ පිළිබඳ විද්වතුන්ගේ අදහස් සමාජය වෙත ගෙනයෑමට හා සංවාදයට ලක් කිරීමට අපේක්ෂා කරමු. මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතාගේ අදහස් මෙවර කලාපයට එක් කර ඇත්තේ ඒ අර්ථයෙනි. මුද්‍රිත ප්‍රකාශන ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන අභියෝගාත්මක තත්ත්වය හේතුවෙන් මුලදී අපට මෙය ප්‍රකාශයට පත් කළ හැකි වන්නේ ඉලෙක්ට්‍රෝනික සඟරාවක් ලෙස පමණකි. එහෙත් ඉදිරියේදී මේ ප්‍රධාන විෂයයන් පිළිබඳ විවෘත මහජන සංවාද පැවැත්වීම අපගේ අපේක්ෂාවයි.

මෙම සංවාදයට එක් වී එය පෝෂණය කිරීම සඳහා දායක වන ලෙස, විශ්වවිද්‍යාල ප්‍රජාවට හා වෘත්තීයවේදීන්ටත් මේ පිළිබඳව උනන්දුවක් දක්වන පුරවැසියන්ටත් ආරාධනා කරමු.

**සංස්කාරක**

# ලංකාවේ නිල නාමය ගැන පවා අලුතින් සිතිය යුතු මොහොතක්

මහාචාර්ය ජයදේව උයන්ගොඩ



ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ විවාදය අලුත් වී තිබෙනවා. එය සිදු වූ පසුබිම වටහා ගැනීම වැදගත් වෙනවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ස්වභාවය, අන්තර්ගතය කුමනාකාර විය යුතුද යන්න හඳුනා ගැනීමට. පසුගිය මාස හතරක පහක කාලය තුළ ලංකාවේ පුරවැසි ව්‍යාපාරය, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුළ ඉතා වැදගත් අවස්ථාවක්. මොකද පුරවැසියන් දේශපාලන වශයෙන් අවදිවෙලා ප්‍රතිසංස්කරණ අවශ්‍යයි කියන මතය ඉතා තදින් මතු වුණා. මීට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ අදහස ආවේ දේශපාලන ප්‍රභූන්ගෙන්. නැත්නම් දේශපාලන පක්ෂවල අයගෙන්, එහෙමත් නැත්නම් සිවිල් සමාජයේ ක්‍රියාකාරිකයින්ගෙන්. මෙවර තිබෙන විශේෂත්වය තමයි ඒ යෝජනාව සාමාන්‍ය

**පුරවැසි ව්‍යාපාරය තුළ තවත් සටන් පාඨයක් ආවා, ඇතැමුන් ඒකට කැමති වුණෙත් නැහැ, ජනාධිපති, අගමැති, ඇමතිවරු පමණක් නෙමේ පාර්ලිමේන්තුවේ ඉන්න නියෝජිතයින් 225ම යන්න ඕන කියන එක. මින් අදහස් කළේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ලංකාවේ තිබෙන ප්‍රධානම ආයතනය වන පාර්ලිමේන්තුව පිළිබඳ පුරවැසි විස්වාසය බිඳ වැටීම.**

පුරවැසියන්ගෙන් පැන නැගීම. සාමාන්‍ය පුරවැසියන් මතු කළා ප්‍රධාන තේමා දෙකක්; එය අපගේ සැලකිල්ලට ලක් කළ යුතුයි.

පළමුවැන්න තමයි, ඔවුන් ලංකාවේ දේශපාලන ක්‍රමයත්, ආණ්ඩු ක්‍රමයත්, දේශපාලක ව්‍යුහයත් පිළිබඳවත් දැඩි විවේචනයක් ඉදිරිපත් කළා. සිස්ටම් චේන්ජ් එකක් ඕන කියන සටන් පාඨය ආවේ, අලුත් දේශපාලන සංස්කෘතියක් ඕන කියල කිව්වේ, දැන් ඉන්න දේශපාලන පක්ෂ සහ මන්ත්‍රීවරු ගැන විස්වාසය තියන්න බෑ කියල කිව්වේ පවත්නා දේශපාලන ක්‍රමය පිළිබඳ ඔවුන්ගේ කලකිරීමේ සහ විවේචනයේ ප්‍රකාශනයක් හැටියට තමයි. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ එක ලක්ෂණයක් තමයි, ඉතා පිරිහුණු ප්‍රජාතන්ත්‍රවාදයක් තිබීම. මෙන්න මේ පිරිහුණු ප්‍රජාතන්ත්‍රවාදය ගැන දැඩි විවේචනයක් ආවා. මේ පිරිහුණු ප්‍රජාතන්ත්‍රවාදය මූලික වශයෙන් වැඩ කරන්නේ පාර්ලිමේන්තු නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය කේන්ද්‍රකොට ගෙන තමයි.

## පුරවැසි අරගලයේ සංඥා

පුරවැසි ව්‍යාපාරය තුළ තවත් සටන් පාඨයක් ආවා, ඇතැමුන් ඒකට කැමති වුණෙත් නැහැ, ජනාධිපති, අගමැති, ඇමතිවරු පමණක් නෙමෙ පාර්ලිමේන්තුවේ ඉන්න නියෝජිතයින් 225ම යන්න ඕන කියන එක. මින් අදහස් කළේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ලංකාවේ තිබෙන ප්‍රධානම ආයතනය වන පාර්ලිමේන්තුව පිළිබඳ පුරවැසි විස්වාසය බිඳ වැටීම. මොකද පුරවැසියන්ගේ විස්වාසයක් තිබෙනවා, පාර්ලිමේන්තුවට පත්වන මන්ත්‍රීවරු දූෂිතයෝ, ඔවුන් මහජන වරමක් ලබා ගන්නේ මහජනයාට සේවය කිරීමට වඩා තමන්ට සේවය කිරීම සඳහාය කියන එක. ඒ වගේම කිසිම වගකීමකින් තොරව දේශපාලන බලය භාවිත කිරීම වගේ හේතු නිසා පුරවැසියන් හිතනවා තමන් දෙන වරම මාර්ගයෙන් තමන්ව නියෝජන කරන්නේ නැහැයි කියලා. ඔවුන් නියෝජනය කරන්නේ වෙන අය, එක්කෝ පක්ෂයේ නායකයෝ, පක්ෂයේ නිලධර තන්ත්‍රය, නැත්නම් පක්ෂයේ මැතිවරණ කටයුතුවලට මුදල් සපයන ව්‍යාපාරිකයන්. මේ නිසා මහජනයාට අවශ්‍යයි තමන්ගේ දුක්ගැනවිලි තේරුම් ගන්නා, තමන්ගේ දුක්ගැනවිලි සහ ඉල්ලීම් ඇත්තවශයෙන්ම නියෝජනය කරන නියෝජිතයින්. ඒ වගේම මහජනයා විශාල කලකිරීමකට පත්වෙලා තියෙනවා තමන් දෙන ජන වරම උල්ලංඝනය කිරීම පිළිබඳව. එසේ උල්ලංඝනය කරන මන්ත්‍රීවරුන්ට මොකද කරන්නේ? අවුරුදු 5ක් යනතුරු බලා සිටිනවාද? ඊට කලින් මොවුන් ඉවත් කරන්න ක්‍රමයක් නැද්ද? මෙන්න මේ විදියට ලංකාවේ තියන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ අඩුපාඩු පිළිබඳ දැඩි විවේචනයක් අපේ පුරවැසියන්ගෙන් මතු වුණා.

ලංකාව තුළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන අප සිතනවා නම්, සිතිය යුත්තේ 19 වැනි සංශෝධනය නැවත ගේනවාද, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කරා නැවත යනවාද වගේ ප්‍රශ්න ගැන පමණක් නොවෙයි. 19 සංශෝධනය සංශෝධන සහිතව නැවත ගේන්නත් ඕන; පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කරා ආපසු යන්නත් ඕන; එක්තරා මූලධාර්මික අරමුණක් මතයි. මා හිතන හැටියට පසු ගිය මාස හතර පහ තුළ පුරවැසි ව්‍යාපාරයෙන් මතු වුණු වැදගත්ම මූලධාර්මික තර්කයක් තමයි මෙන්න මේක; ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය නිර්-ලිබරල් (Illiberal), ඉතාම දැඩි අධිකාරිවාදී ජනාධිපති ක්‍රමයක් තුළ විකෘති කරනු ලැබූ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක්. අපට අවශ්‍ය වන්නේ පැලැස්තර යන වචනයෙන් හඳුන්වන මතුපිට වෙනස්කම් නෙවෙයි. මූලික ප්‍රතිසංස්කරණ සිදු විය යුතුයි. ඒවා ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය යළි ගොඩනැගීමේ, ගැඹුරු කිරීමේ සහ පුළුල් කිරීමේ ක්‍රියාවලියක් සමග සම්බන්ධ කළ යුතුයි.

## නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ සීමා

ලංකාවේ දේශපාලනය ප්‍රජාතන්ත්‍රීයකරණය පිළිබඳ නව අවදියක තමයි අප සිටින්නේ.

**මහජනතාව විසින් පත් කරන ජනතා නියෝජිතයන් නැවත කැඳවීමේ බලයක් ව්‍යවසථානුකූලව තිබෙන්න ඕන කියන අදහස ඇතැම් දේශපාලන පක්ෂ හා කණ්ඩායම්වලින් මතුවෙනවා. එය ඉතාම වැදගත් අදහසක් හැටියට සැලකිල්ලට ගතයුතු එකක්.**

මෙන්න මේ නව මොහොත කොහොමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රයෝජනයට ගන්නේ? එවිට අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ දෙස බැලිය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මතුපිට වෙනස්කම් කිරීමේ අරමුණින් නොවේ, ලංකාවේ දේශපාලනය සමස්තයක් හැටියට, ආණ්ඩුක්‍රම ව්‍යුහය, දේශපාලන සංස්කෘතිය, රාජ්‍ය සහ පුරවැසියා අතර තිබෙන සම්බන්ධය, පාලකයින් සහ ජනතාව අතර තියෙන සම්බන්ධය අලුත් කිරීම වැනි කාරණා සම්බන්ධ කරන හරයාත්මක ප්‍රතිසංස්කරණ රාමුවක් පිළිබඳව හිතන්න ඕන.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපත්තිමය කොටස කියල මා හිතන්නේ මෙන්න මේ මූලධාර්මික සංකල්පීය පැත්ත කුමක්ද කියන එක. ඒ පිළිබඳ සාකච්ඡාවක් ලංකාවේ ඇති විය යුතුයි කියලා මා තරයේ විස්වාස කරනවා. හේතුව තමයි, තවමත් බොහෝ දෙනා හිතාගෙන ඉන්නවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කරනවා නම්, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ සීමිත රාමුව තුළ පමණයි කරන්න ඕන කියලා. නමුත් පසුගිය කාලය තුළ සමහර දේශපාලන පක්ෂවලිනුත් ආපු අදහස්වලින් යෝජනා වෙනවා අපි සාම්ප්‍රදායික ලිබරල් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ සීමාවන් ඉක්මවා යා යුතුය කියන එක. මා නිදසුනක් කියන්නම්, මහජනතාව විසින් පත් කරන ජනතා නියෝජිතයන් නැවත කැඳවීමේ බලයක් ව්‍යවස්ථානුකූලව තිබෙන්න ඕන කියන අදහස ඇතැම් දේශපාලන පක්ෂ හා කණ්ඩායම්වලින් මතුවෙනවා. එය ඉතාම වැදගත් අදහසක් හැටියට සැලකිල්ලට ගතයුතු එකක්. නමුත් ඔය කාරණයේ ප්‍රශ්නයක් තිබෙනවා, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තුළ ආපසු කැඳවීම සඳහා (Right to Recall) ඉඩකඩ ලැබෙන්නේ නැහැ. බොහෝ විට සාමාන්‍යයෙන් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළින් පමණක් ව්‍යවස්ථාව ගැන හිතන අය ඔය යෝජනාවට විරුද්ධ වෙනවා. මා එය හොඳටම දන්නවා. ඊට හේතුව තමයි ප්‍රජාතන්ත්‍රය පිළිබඳ ලිබරල් න්‍යාය තුළ නැවත කැඳවීම සඳහා ඉඩකඩ නැහැ. ඇත්තවශයෙන්ම නැවත කැඳවීම සඳහා ඉඩකඩ එන්නේ සමූහාණ්ඩුවාදී දේශපාලන න්‍යාය තුළ සහ සෘජු ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය තුළයි.

ලංකාවේ අලුතින් අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කරනවා නම්, අපේ පුරවැසියන්ගේ ඉල්ලීම්වලටත් කන් දීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයේ තිබෙන අඩුපාඩු පිරවීම සඳහා කටයුතු කරනවා නම් ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ලිබරල් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ සීමිත රාමුව තුළ පමණක් ඉන්නට බැහැ. අපි ඒක වඩාත් ගැඹුරු කරන්න ඕන, නැත්නම් පුළුල් කරන්න ඕන. ඒ සඳහා අපට මූලාශ්‍ර දෙකක් තිබෙනවා, එකක් තමයි සමූහාණ්ඩුවාදී ප්‍රජාතන්ත්‍රවාදය, අනෙත් එක තමයි සෘජු ප්‍රජාතන්ත්‍රවාදය. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, පුරවැසියන්ට සෘජුව නීති සම්පාදනයට, ආණ්ඩුකරණ ක්‍රියාවලියට සහභාගී විය හැකි ක්‍රමයක්.

## ප්‍රතිසංස්කරණ සඳහා නිර්මාණාත්මක ප්‍රවේශයක්

ලංකාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ගැන හිතනකොට, මා කලින්

යෝජනා කළා වගේ ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදය සහ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය අතහරින්නේ නැතිව එය පවත්වාගෙන යන ගමන් සෘජු ප්‍රජාතන්ත්‍රවාදය සහ සමූහාණ්ඩු ප්‍රජාතන්ත්‍රවාදයේ අංග නිර්මාණාත්මක ලෙස සම්බන්ධ කරන්නේ කොහොමද කියන එකට සාකච්ඡාවක් අවශ්‍යයි. නමුත් තවමත් ඒ සාකච්ඡාව ලංකාවේ මතුවෙලා නැහැ. එය සමහර වෙලාවට අප හිතන ආකාරයේ අලුත් දේශපාලන චින්තනයක් මත පදනම් වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගොඩනැගීමට බාධාවක් වෙන්න පුළුවන්. මා හිතන්නේ පළමුවෙන්ම අපට කරන්න තියෙන දෙයක් තමයි, ලංකාවේ පුරවැසි ව්‍යාපාරය තුළින් මතු වුණු, ලංකාවේ දේශපාලන ක්‍රමය හා ආණ්ඩුකරණය පිළිබඳ විවේචනය පමණක් නෙවෙයි පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ගැන ඇති විවේචනත් සැලකිල්ලට ගෙන අලුතින් සිතන්න ඕන. ඇත්ත වශයෙන්ම ඒ අලුතින් සිතීමට ලෝකයේ අනෙකුත් රටවල නිදසුන් ආධාර කර ගන්න ඕන. මම නිදසුන් කීපයක් කියන්නම්.

**ලංකාවේ පුරවැසි ව්‍යාපාරය තුළින් මතු වුණු, ලංකාවේ දේශපාලන ක්‍රමය හා ආණ්ඩුකරණය පිළිබඳ විවේචනය පමණක් නෙවෙයි, පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ගැන ඇති විවේචනත් සැලකිල්ලට ගෙන අලුතින් සිතන්න ඕන. ඇත්ත වශයෙන්ම ඒ අලුතින් සිතීමට ලෝකයේ අනෙකුත් රටවල නිදසුන් ආධාර කර ගන්න ඕන.**

ඉන්දියාව: ඉන්දියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් මගින් හැදුවේ. ඇත්තවශයෙන්ම එය සකස් වී තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ දේශපාලන චින්තන සම්ප්‍රදායන් තුනක් එකතු කිරීමෙන්. එහි ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා, සමූහාණ්ඩුවාදී ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා, සමාජවාදය නැත්නම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය තිබෙනවා. ඒ ලක්ෂණ තුනම එකතු කරලයි තිබෙන්නේ. එය කවදාවත් බ්‍රිතාන්‍යයෙන් නියෝජනය වුණු ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සීමාවන් තුළ හිර වුණේ නැහැ. ඒ නිසා අපට ඉගෙන ගන්න තියෙනවා බොහෝ විට එවැනි සම්ප්‍රදායන්ගෙන්. ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සලකා බැලුවම, බොහෝ දෙනා අමතක කරන දෙයක් තමයි, ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිබරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පමණක් නොවන බව. එහි සමූහාණ්ඩුවාදී ලක්ෂණ ඉතා තදින් තිබෙනවා. ස්විට්සර්ලන්තයේත් එහෙමයි,

තුන්වන ලෝකයේ රටවල්වල නිදසුනක් ලෙස චිලී රටේ මෑතක ලංකාවේ වගේම විශාල මහජන නැගීමක් මතු වුණා. අවුරුදු දෙකක් තුනක් තිස්සේ එය පැවතුණා, දැන් චිලී රටේ මහජන ව්‍යාපාරය තුළින් මතු වුණු අදහසුත් අරගෙන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා විශාල සාකච්ඡාවක් තිබෙනවා. මේ දිනවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයන් ව්‍යවස්ථාවක් සම්පාදනය කරනවා. ඒ අයත් පුරවැසි ව්‍යාපාරය තුළින් මතු වුණු අදහසුත්, පවස්තින අධිපති ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවාදයේ චින්තනය ශක්තිමත් කිරීමට සහ එහි අඩු පාඩු පිරවීමට සම්බන්ධ කර ගන්නවා. එහෙත් සාම්ප්‍රදායික ලිබරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදීන් සහ දක්ෂිණාංශ කොටස් ඊට එකඟ නැහැ. ලංකාවෙත් ඕක වෙන්න පුළුවන්, ලංකාවෙත් දක්ෂිණාංශික කොටස්, දැනට අර පිරිහුණු පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයෙන් වාසි ලබන සමාජ පන්තියේ සිටින පුද්ගලයන් මෙය සංශෝධනය කරන්න කැමති වෙන්නේ නැහැ. ඒ නිසා තමයි මා

හිතන්නේ ලංකාවේ පුරවැසි ව්‍යාපාරය දැනට පසුබෑමකට ලක්වෙලා තිබුණත් ඉදිරි කාලයේදී ලංකාවේ දේශපාලනය තුළ වැදගත්ම සාධකයක් හැටියට සිටිය යුතුයි.

## ශක්තිමත් සංවරණ හා තුලන ක්‍රමයක්

ඊට මා තව හේතුවක් සඳහන් කරන්නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විවාදය තුළ ඉතාම වැදගත් තර්කයක් ලෙස මතු වෙනවා, දේශපාලන බලය අයුතු ලෙස පාලකයන් විසින් ප්‍රයෝජනයට ගැනීමට, ප්‍රජා පීඩක ලෙස භාවිත කිරීමට තිබෙන අවකාශය වැළක්වීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්ම නිර්ණය කරන සංවරණ සහ තුලන ක්‍රමයක් ඇති කළ යුතුය කියන කාරණය. ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්ප්‍රදාය තුළ ඒ වගේ ඉතා ශක්තිමත් සංවරණ සහ තුලන ක්‍රම තිබෙනවා. ව්‍යවස්ථාදායකයටවත් විධායකයටවත් බැහැ හිතුවක්කාරී ලෙස මහජනයාට පීඩාකාරී වන ආකාරයට ක්‍රියා කරන්න. එක ආයතනයක් විසින් අනෙක් ආයතනය පාලනය කරනවා. ඒ වගේම ලංකාවේ තියෙන වැදගත් යෝජනාවක් තමයි ස්වාධීන කොමිෂන් සභා පත් කරන්න ඕන කියන එක. ස්වාධීන කොමිෂන් සභා ඉතා වැදගත් වගේම එයත් සංවරණ සහ තුලන ක්‍රමයක් වෙනවා. නමුත් අපට පසු ගිය පුරවැසි ව්‍යාපාරය තුළින් මතු වුණු වැදගත්ම අදහසක් තිබෙනවා. පුරවැසි ව්‍යාපාරයේ ඉන්න ක්‍රියාකාරීන් මේ ගැන සිතා තිබෙනවාදැයි දන්නේ නැහැ, නමුත් එහි නිරීක්ෂකයෙක් වශයෙන් මා දකින දෙයක් තමයි රාජ්‍ය බලය, දේශපාලනය කවුරුන් හෝ අයුතු ලෙස ප්‍රයෝජනයට ගනු ලබනවා නම්, ප්‍රජා පීඩක ලෙස එය පාවිච්චි කරනවා නම් එය වැළක්වීමට සංවිධානය වූ පුරවැසියන් ඉතාම ප්‍රබල සංවරණයක් වනවාය කියන කාරණය. මෙය සමාජය වෙතින්, පුරවැසියන් වෙතින් මතු වන සංවරණයක්.

එවිට අපි බලන්න ඕන ඊළඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අපට අවකාශ තියනවද කියලා සාම්ප්‍රදායික ආයතනගත සංවරණ සහ තුලන ක්‍රමවලට අමතරව ලංකාවේ පුරවැසියන් විසින්, තමන්ගේ දේශපාලන නිර්මාණාත්මකභාවය ඔස්සේ යෝජනා කරනු ලැබූ අදහසුත් කොහොමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන්නේ කියලා. බොහෝ වෙලාවට සාම්ප්‍රදායිකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගැන හිතන බොහෝ දෙනා මේ වගේ තැන්වලදි කියන්න පුළුවන්, මෙය ප්‍රජාතන්ත්‍රවාදී නැහැ, තාක්ෂණික වශයෙන් හරි අමාරුයි කියලා. නිදසුනක් ලෙස මා දන්නවා අපි කතා කරන, 'නැවත කැඳවීමේ බලයට' විරුද්ධ වෙන්න එය තාක්ෂණික වශයෙන් බොහොම සංකීර්ණ වීම හේතුවක් වෙන්න පුළුවන් කියලා. වෙන රටවල අත්දැකීම් තියනවා, ඇමෙරිකාව, ස්විට්සර්ලන්තය වගේ රටවල් ගණනාවක අත්දැකීම් තිබෙනවා, ඒ අත්දකීම්වලිනුත් ඉගෙනගෙන අර සංකීර්ණතාව නොතකා, අයුතු ලෙස ප්‍රයෝජන ගැනීමට ඉඩ නොලැබෙන ලෙස අවශ්‍ය සංශෝධන සහිතව පුරවැසියන්ට කොහොමද ප්‍රජාතන්ත්‍රවාදී ශක්තිය ලබා දෙන්නේ කියලා බලන්න ඕන.

## ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී වීම

ඇත්තවශයෙන්ම පුරවැසියන් තමයි දේශපාලන බලයේ උල්පත. මෙවර අරගලයේත් මතු වුණා පරමාධිපත්‍ය තිබෙන්නේ ජනතාවටය කියන කාරණය. එහෙම නම් පරමාධිපත්‍ය සහිත ජනතාවගේ බලය, ඔවුන්ගේ විවේචන, ඔවුන්ගෙන් වරින් වර මතු වුණ වැදගත් අදහස් කොහොමද අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනයට පළමුවෙන්ම ඇතුළත් කර ගන්නේ කියල බලන්න ඕන. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා න්‍යායට සහ චින්තනයට මේ අදහස් ඇතුළත් කර ගන්න වෙනවා. ඉන් පසුව තමයි ආණ්ඩුක්‍රම විධිවිධාන බවට ඒවා පත් කරන්න වෙන්නේ. මගේ යෝජනාව තමයි අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක විධිවිධාන ගැන සිතීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංකල්පීය මූලධර්ම ගැන පැහැදිලි කමක් තියෙන්න ඕන. ලංකාවේ කරන ලොකු වැරද්දක් තමයි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

ප්‍රතිසංස්කරණවලදී, පළමුවෙන්ම කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ නීතිඥයෙක් තනියම කෙටුම්පත් කරනවා. පහුගිය 21, 22 සංශෝධන සියල්ල කළේ කොහොමද? අඩුම තරමේ ගෝල්ෆේස් අරගලයේ විශාල වශයෙන් නියෝජිතයෝ ඉන්නවා, කවුරුවත් ගිහින් ඔවුන් හමුවුණේ නැහැ, ඔවුන්ගේ අදහස් මොනවද කියල ඇහුවේ නැහැ. එක නීතිඥයෙක් හෝ කණ්ඩායමක් එකතු වෙලා ව්‍යවස්ථා කෙටුම්පතක් හදලා ඒක ඉදිරිපත් කරනවා. ඉන්පසු ශ්‍රේෂ්ඨාධිකරණයට යවනවා එහි වලංගුභාවය ලබා ගන්න. ජනතාවගෙන් අහන්නේ නෑ, මේ ගැන ඔබේ අදහස් මොනවද කියලා. එය සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍රීය නොවන වැඩක්. මගේ නම් තර්කය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියක අන්තර්ගතය ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුයි, සංශෝධනය කරන ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුයි වගේම, අන්තර්ගතය සකස් කරන්නේ කෙසේද, අන්තර්ගතයට ඇතුළ් කරන්නේ මොකක්ද කියන ක්‍රියාවලියත් දැන් ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුයි.

ප්‍රජාතන්ත්‍රවාදී කියන වචනේ තේරුම ගත්තොත්, අපි ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ Democracy කියලා. ඩිමෝස් කියන්නේ කවුද? ඩිමෝස් කියන්නේ සාමාන්‍ය ජනතාව කියන එක. ජනතාවගේ ආණ්ඩුක්‍රමය, නියෝජන ක්‍රමයේ තියෙන එක වැරැද්දක් තමයි, ලංකාවේ විතරක් නෙමේ බ්‍රිතාන්‍යයේ සිට හැම රටකම මේක තියෙනවා. මේ ක්‍රමය නිසා ඉඩ ලබාදී තිබෙනවා සීමිත, වරප්‍රසාද සහිත දේශපාලන ප්‍රභූතන්ත්‍රයට සමස්ත දේශපාලන ක්‍රියාවලියම පැහැරගෙන, අත්පත් කරගෙන තමන්ගේ ඒකාධිකාරිය යටතේ තියාගෙන ඉදීමට. ලංකාවේ සිදුවෙලා තියෙන්නේ ඒකයි. අද වෙලා තියෙන්නේ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය අත්පත් කරගෙන, පැහැරගෙන තිබෙනවා අතිශයෙන්ම දූෂිත, බලය ස්වාර්ථය පමණක් සඳහා යොදා ගන්නා දේශපාලන පංතියක ආධිපත්‍යයට. පුරවැසි ව්‍යාපාරය තුළින් මතුවුණු ප්‍රබලම තර්කයක් තමයි, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය දූෂිත ආත්මාර්ථකාමී ප්‍රභූ පන්තියේ ග්‍රහණයෙන් මුදවා ගැනීම. මෙය නැවත ජනතාව වෙතට, පුරවැසියන් වෙතට ආපසු ගන්න ඕන. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් කල්පනා කළ යුතු කාරණයක්. මෙය තමයි අපේ පුරවැසි ව්‍යාපාරය තුළින් දෙන ඉතා ප්‍රබලතම පණිවිඩය. ඒ නිසා තමයි මා හිතන්නේ 2022 වසරේදී ඓතිහාසික ලෙස අවස්ථාව විවෘත වෙලා තියෙනවා ලංකාව නැවත වරක් ප්‍රජාතන්ත්‍රීය කිරීමට. මෙය ඓතිහාසික මොහොතක්. ඒ මොහොත අපි මග නොහැරිය යුතුයි.

## නව මූලධාර්මික ප්‍රවේශයක්

ලංකාව යළි ප්‍රජාතන්ත්‍රවාදී කිරීම සඳහා තිබෙන මේ ඓතිහාසික මොහොත ප්‍රයෝජනයට ගන්නේ කොහොමද? පිරිහුණු දේශපාලන පන්තියේ සීමිත අදහස්වලට පමණක් සීමා නොවී, පුරවැසියන්ගෙන් මතු වී තිබෙන පොහොසත් නිර්මාණාත්මක අදහස් කොහොමද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන්නේ කියලා කල්පනා කළ යුතුයි.

අපට ඊළඟට මතුවන ප්‍රශ්නය තමයි, ලංකාවේ දේශපාලන ඉතිහාසය, පුරවැසියන්ගේ අතීත අත්දැකීම්, අප ළඟ දැනට තිබෙන විවේචන සහ පුරවැසි ව්‍යාපාරය තුළින් මතු වුණු විවේචනත් නව අදහසුත් අරගෙන කොහොමද මූලධාර්මික සංකල්පීය රාමුවක් හදා ගන්නේ කියන එක. ඊළඟ ප්‍රශ්නය තමයි මෙතනින් ඉස්සරහට යන්නේ කොහොමද කියන එක. අපට එතනදි කාරණා කිහිපයක් කතා කරන්න පුළුවන්, පළමුවැනි එක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියත් ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුයි. අපට තිබෙන තවත් ඓතිහාසික අවස්ථාවක් තමයි, ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේ පදනම වන මූලධර්ම පද්ධතියට, පාර්ලිමේන්තු මැතිවරණයක් තුළින් ජන වරමක් ලබා ගැනීම. කෙටුම්පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට නෙමේ, එය 1970 දීත් වුණා. ඔවුන් අලුතෙන් ජන වරමක් ගත්තේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි

කරලා, ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා කියන අදහසට පමණයි. පුරවැසි ව්‍යාපාර සහ අපේ රටේ අත්දැකීම්වලින් අපට ඉගෙනගන්න තියෙන දෙයක් තමයි, ඊළඟ මැතිවරණයකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ තමන්ගේ පක්ෂයේ මූලික යෝජනා, මූලික මූලධර්ම සහ මූලික ප්‍රතිපත්ති රාමුව කුමක්ද කියන එක මැතිවරණ ප්‍රකාශනයට ඇතුළත් කරලා හැම පක්ෂයක්ම ඒ සඳහා ජනවරමක් ගත යුතුයි. එය තමයි වඩාත්ම ප්‍රජාතන්ත්‍රවාදී වෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියක වැදගත්ම මූලධර්මයක් තමයි, එම ක්‍රියාවලියට ජනතාවගේ සහභාගිත්වය සහ ජනතාවගේ කැමැත්ත කියන දෙකම ලබා ගැනීම. තවදුරටත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විශේෂඥයකුගේ හෝ දේශපාලන ක්‍රියාධරයකුගේ කාර්යයක් පමණක් නොවිය යුතුයි.

## නිල නාමය අර්ථවත් කිරීම

අනෙක් වැදගත්ම දේ තමයි අපි නව ව්‍යවස්ථාවක් සඳහා සාකච්ඡා කරන මූලධර්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිච්ඡේද සහ විධිවිධාන ලෙස අන්තර්ගත කරන්නේ කොහොමද කියන කාරණය. ඒ ගැනත් සාකච්ඡාවක් තියෙන්න ඕන. ඊට ප්‍රධාන හේතුව තමයි, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවල සීමාවන් ජය ගැනීමට සිදුවෙනවාමයි, මෙවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලියේදී. ඒ සඳහා අපට තිබෙන එක ආධාරකයක් තමයි, ලංකාවේ රාජ්‍යයේ නිල නම ගැන නැවත සිතන එක. ලංකා රාජ්‍යය හඳුන්වන වචන තුන බොහෝ දෙනාට අමතක වෙලා තියෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජය. ලංකාව ප්‍රජාතන්ත්‍රවාදීත් නැහැ, සමාජවාදීත් නැහැ, ජනරජයකුත් නෙමේ. ඇත්තටම අපිට දැන් ස්වර්ණමය අවස්ථාවක් ලැබිලා තියෙනවා. මෙන්න මේ ව්‍යාජ වචන තුනට ඇත්තවශයෙන්ම සැබෑ අර්ථයක් දෙන්න. ලංකාව සැබෑ ලෙස ප්‍රජාතන්ත්‍රවාදී කරන්න ඕන. -සමාජවාදී කියන එකට අවකාශ නැහැ ඓතිහාසික වශයෙන්- නමුත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ඇතුළත් කරන්න පුළුවන්. අපට ඉන්දියාවෙන් ඉගෙනගන්න පුළුවන් මේ සඳහා පාඩම්. සමූහාණ්ඩුවාදයේ මූලධර්ම මොනවද කියලා. ආපසු කැඳවීම, පාර්ලිමේන්තුවට සමාන්තරව නීති සම්පාදනය සඳහා, නීති සම්පාදනයට අදහස් පළ කිරීම සඳහා ජනතා නියෝජිතයන්ට කොහොමද අවස්ථාව ලබා දෙන්නේ කියන කාරණය, දේශපාලන බලය තිබෙන්න ඕන; ව්‍යවස්ථාදායක බලය තිබෙන්න ඕන පාර්ලිමේන්තුවට තේරුණු නියෝජිතයන්ට පමණද, නැත්නම් ජනතාව විසින් ඒ කියන්නේ වෘත්තීය සමිති, කාන්තා සංවිධාන, ගොවි සංවිධාන වැනි පොදු ජන සංවිධාන විසින් තෝරා ගන්නා නියෝජිතයන් නීති සම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ කරන්නේ කොහොමද යනාදී කාරණා අලුතෙන් සිතිය යුතුයි.

දැනට ලංකාවේ තිබෙන්නේ ඒක මණ්ඩලීය ව්‍යවස්ථාදායකයක්. ඒ කියන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විතරයි. ලංකාවේ මීට පෙර තිබුණා බ්‍රිතාන්‍ය උරුමයෙන් ආපු ද්විතියික මන්ත්‍රී මණ්ඩලයක්. ඒක අහෝසි කළා පමණයි. විකල්පයක් වශයෙන් ඒක ගේන්න පුළුවන් නැවත නිර්මාණාත්මක ලෙස. දැන් ලංකාවේ බොහෝ දෙනාගේ අදහසක් තියෙනවා ජන සභාවක් ගැන. ජන සභා නැත්නම් මහජන සභා. ද්විතියික මන්ත්‍රී මණ්ඩලය ගැන අලුතෙන් සිතිය යුතුයි, මෙම මහජන සභා (People Council) කියන අදහසත් ආශ්‍රය කරගෙන. ලංකාවේ විශාල වෘතිය සමිති තිබෙනවා, ගොවිජන සංවිධාන තිබෙනවා, ස්ත්‍රීන් සංවිධානය වෙලා තිබෙනවා, පීඩිත කුලවල සංවිධාන තියෙනවා (ඒවා බොහෝ විට යට ස්ථරයේ තිබෙන්නේ තවම මතුවෙලා නැහැ) සුළු ජන කොටස්වල සංවිධාන තිබෙනවා. අන්න ඒවගේ නියෝජිතයන් කොහොමද වෙනම තෝරා ගන්නේ? වෘත්තිය සමිතිවලට කියනවා තමන්ගේ නියෝජිතයන් 10 දෙනෙක් තෝරා පත් කරන්න කියලා, එවැනි අය ජනතාවගේ ඍජු නියෝජිතයන්. ඍජුව තමන්ගේ ඡන්දෙන්


තෝරා පත් කරන අය ඔවුන්ගේ මණ්ඩලවල. ඒ වගේ නිර්මාණාත්මකව හිතන්න පුළුවන්.

ව්‍යවස්ථා නිර්මාණය කියන කාරණයේදී තාක්ෂණික ප්‍රශ්න අනිවාර්යයෙන් තිබෙනවා. තාක්ෂණික ප්‍රශ්න පැන නගින්න ප්‍රධානම හේතුව තමයි ලිබරල් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන සීමාවන්. අපට ඒවා ජය ගන්නට පුළුවන්. මගේ යෝජනාවෙන් අදහස් කරන්නේ නැහැ, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම අත හරින්න ඕන කියලා. එහි තිබෙන අඩු පාඩු සහ සීමාවන් තමයි ජය ගත යුත්තේ. එහිදී අපි පරිස්සම් විය යුතු කාරණයක් තමයි, සෘජු ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම හඳුන්වා දෙනකොට මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නත් මතුවෙන්න පුළුවන් කියන එක. නිදසුනක් ලෙස; මූලික අයිතිවාසිකම් පිළිබඳ අපේ පරිච්ඡේදයක් තියෙනවා නම්, මහජන සභාවෙන් මතු වෙන යෝජනා එහි සීමාවට යටත් කරන්න ඕන. එතකොට අපි හිතන්න නරකයි ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම, ඒ වගේම සමූහාණ්ඩුවාදී මූලධර්ම එකිනෙකට බැහැර කරනසුලු, එකිනෙකට පසමිතුරු මූලධර්ම කියලා. ඒවා අතරත් සංවාදයක් ඇති කරන්න ඕන.

ලංකාවේ තියන එක ගැටලුවක් තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනයක් නැතිකම. අපේ දේශපාලනඥයෝ අතරත් නැහැ, නීතිඥයෝ අතරත් නැහැ. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන වෙලාවේ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා හෝ, සම සමාජ පක්ෂය හෝ ලංකාවට සමූහාණ්ඩුවක් අවශ්‍ය ඇයි කියල න්‍යායිකව පැහැදිලි කරලා නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩල වාර්තා පරිශීලනය කළොත් පෙනෙයි, එය ලංකාවට සමාජවාදී මූලධර්ම හඳුන්වා දුන්නා කියන එක න්‍යායික වශයෙන් පැහැදිලි කරලා නැහැ. 72 ව්‍යවස්ථාව ගෙන බැලුවම පේනවා එය ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනය දියුණු කරන්න ඉතාම හොඳ අවස්ථාවක් කියලා. නමුත් එසේ කළේ නැහැ. ඊට පස්සෙවත් ඒක වුණේ නැහැ. පසුගිය කාලේදී 19 වැනි සංශෝධනය ආවා. 19 ව්‍යවස්ථාවට පදනම් වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්ම, එහි තිබෙන දේශපාලන න්‍යායික චින්තනය කුමක්ද කියලා හොයා ගන්න නැහැ. තියෙන්නේ තාක්ෂණික පැහැදිලි කිරීම් විතරයි. අපි හිතමු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් අරගෙන ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම එහි තර්ක කරන්නේ මූලික තාක්ෂණික කරුණු ගැන පමණයි. තාක්ෂණික ගැටලු නැතුව මූලධාර්මික කරුණු ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ තර්ක කළොත් අනිවාර්යයෙන්ම විනිශ්චයකාරවරු නීතිඥයින්ට කියයි අපට ඕවා අවශ්‍ය නැහැ, අපි තීරණය කරන්නේ තාක්ෂණික නීතිමය ප්‍රශ්න විතරයි කියලා. ඉන් පේනවා ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනය සහ ඒ පිළිබඳ අධිකරණමය ප්‍රවිශයේ තිබෙන සීමාකම් මොන වගේද කියලා. ඒවාද ජය ගත යුතුයි, මගේ නම් තර්කය වන්නේ තාක්ෂණික කරුණු අභියෝගයක් වෙන්නේ ඒ පිළිබඳ මූලධාර්මික පැහැදිලි කමක් නොමැතිවීම නිසා. ■

# ව්‍යවස්ථාව සම්පාදනය විය යුත්තේ මහජන සහභාගිත්වයෙන්

**එරාන් වික්‍රමරත්න**
පාර්ලිමේන්තු මන්ත්‍රී (සමගි ජන බලවේගය)



රටක, සමාජයක ව්‍යවස්ථා සම්පාදනයට යනවා නම් ඊට ප්‍රථමයෙන් අපි අහන්න ඕන ප්‍රශ්නය තමයි අපේ සමාජයේ තිබෙන අගයන් මොනවද කියලා. මම ලංකාවේ ඉපදෙන්න තෝරාගත්තේ නැහැ. මට පස්සේ මේක ලංකාව බව දැනගත්තා. මම සිංහල ජාතිය තෝරාගත්තේ නැහැ, පස්සේ මම සිංහල ජාතිකයෙක් කිව්වා. මම වික්‍රමරත්න පවුල තෝරගත්තෙත් නැහැ, පස්සේ මට කිව්වා මගේ නම වික්‍රමරත්න කියලා. අපි හුගක් මිනිස්සුන්ට කියන්නේ මේ තෝරාගත්තේ නැති ඒවාට වග කියන්න ඕන නෑ කියලා. අපි වග කියන්න ඕනේ අපි ගන්න තීරණවලටයි. මොනවද අප සමාජයේ තිබෙන අගයන්? හැමෝම එක හා සමාන වෙන්න ඕන, හැමෝටම අපි ගරු කරන්නට ඕන, ඒ වගේම අපේ නීතියේ රාමුව තුළ කටයුතු කරන්න ඕනද නැද්ද කියන ප්‍රශ්නයත් අපි අහන්න ඕන එකක්. එකයි අපට ව්‍යවස්ථාව වැදගත් වෙන්නේ. ඒ වගේම අපි ප්‍රජාත්නත්‍රවාදී ජීවන ක්‍රමයක් හොයනවද, ප්‍රජාතන්ත්‍රවාදී විදියට ජීවත් වෙනවද? සමහර

**අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසන් සභාවේ, අවුරුදු 28ක ඉතිහාසය තුළ එක ප්‍රසිද්ධ නිලධාරියකු හෝ දේශපාලකයකු අධිකරණය හමුවට පමුණුවලා දඬුවම් ලබාදීල නැහැ. ඒකෙ ස්වාධීනත්වයක් නැහැ. ඒක ස්වාධීන කරන්නට ඕන.**

රටවල එහෙම තෝරා ගැනීමක් සිදු වෙලා නැහැ. අප අතරේ දුප්පත් අය ඉන්නවා. සමාජ සාධාරණත්වයක් ලැබිය යුතු දරුවන් ඉන්නවා, වැඩිමහලු අය ඉන්නවා. ඉතින් මේ අගයන් තීරණය කරලා තමයි ව්‍යවස්ථා සම්පාදනයට යන්න පුළුවන්.

ව්‍යවස්ථාව සම්පාදනය කරන කොට අපි කල්පනා කරන්න ඕනේ, හුගක් වෙලාවට අපි බහුතරවාදයට යනවා, බහුතරවාදය විතරක් මදි, අපි අධිකරණයකට ගියාම බහුතරවාදයට අනුව නෙමේ, අධිකරණයෙන් තීරණ දෙන්නේ. අපි මේකෙන් ප්‍රවේසම් වෙන්න ඕන. අලුත් දේශපාලන න්‍යාය අනුව අපි දන්නවා ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය එකිනෙකින් වෙන් වෙන්න ඕන. අපේ රාජධානි ක්‍රමය එහෙම නෙමේ, රජතුමා තීරණය කරනවා හැමදේම. රජතුමා අධිකරණ තීරණත් ගත්තා. දැන් එහෙම කරන්නට බැහැ.

## 'සිස්ටම් චේන්ජ්' කියන්නේ මොකක්ද?

රට තුළ ලොකු ඉල්ලීමක් තියනවා, කාන්තාවන් සහ තරුණයන් නියෝජනය වෙන්න ඕන කියලා. ඔව් ඒ අය නියෝජනය වෙන්න ඕන, ඒ අයගේ හැකියාවෙන්. නමුත් රටේ ප්‍රශ්නයක් තියනවා, ඒ නිසා තමයි, අපි කෝටා එකක් හෝ දාල ඒ අයව ගේන්න ඕන. අරගලේදී කෑගැහුවේ, සිස්ටම් චේන්ජ් කියලා, සිස්ටම් චේන්ජ් කියන්නේ මොකක්ද කියල කෙටියෙන්ම කිව්වොත්; පාලනය කරන අය කවුරු වුණත් වගකීමෙන් කටයුතු කළ යුතුයි. වගකිව යුතුයි. මේක තමා හුගක් අය ප්‍රශ්න කරන්නේ. 19 වැනි සංශෝධනය අපි ගෙනාවා, එහි ජනාධිපතිතුමාට උසස් තනතුරුවලට යෝජනා කරන්න පුළුවන්, නම් කරන්න පුළුවන්, නමුත් ඒ අතරතුරදී, යෝජනා කරන පුද්ගලයන් සුදුසුද නැද්ද කියල තීරණය කරන්නේ ස්වාධීන කණ්ඩායමක්, එකයි ව්‍යවස්ථාදායක සභාවක් තියෙන්නේ. එකයි ස්වාධීන කොමිෂන් සභා තියෙන්නේ. පොලිසියට ස්වාධීන කොමිසමක් තියෙන්න ඕන, අල්ලසට දූෂණයට එරෙහි

> **කවුද ජාවාරම් කාරයෝ පත් කළේ? චෝදනාවක් තියනකොට, මිනිමරුවෙක් කියල උසාවියකින් තීරණයක් දීලා තියෙනකොට වැඩි ඡන්දයෙන් පත් කළේ කවුද? එකට වග කියන්න ඕන 225 නෙමේ, ඡන්දේ දුන්න අය. අපි පුරවැසියන් හැටියට වගකීම ගන්න ඕනෑ.**

ස්වාධීන කොමිසමක් තියෙන්න ඕන. 19 ව්‍යවස්ථාව හරහා හිටපු ජනාධිපතිතුමාගේ ළඟම නිලධාරියෙක් අල්ලාගෙන දඬුවමකුත් දුන්නා. නමුත් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසන් සභාවේ, අවුරුදු 28ක ඉතිහාසය ඇතුළත එක ප්‍රසිද්ධ නිලධාරියකු හෝ දේශපාලකයකු අධිකරණය හමුවට ගෙනැවිත් දඬුවම් ලබාදීල නැහැ. ඒකෙ ස්වාධීනත්වයක් නැහැ. ඒක ස්වාධීන කරන්නට ඕන. ඒ වගේම ප්‍රසම්පාදන කටයුතු, මහජන සේවය, විගණන කොමිසම, මේ සියල්ල ස්වාධීන වෙන්න ඕන. එවිට තමයි වගවීම වැඩි කරන්නට පුළුවන්. මේක තමා රටේ ඉල්ලීම.

ඒ වගේම තව ඉල්ලීමක් තියෙනවා බලය බෙදන්න ඕනේ කියලා. පාර්ලිමේන්තුවේ ඉන්න අය විතරක් හැම තීරණයක්ම ගන්න ඕන නෑ, මමත් එක පිළිගන්නවා, බලය බෙදී යන්න ඕන, උදාහරණයක් විදියට සංචාරක ව්‍යාපාරය ගත්තොත්, මාතර, ත්‍රිකුණාමලේ, මේ හැම තැනම එක විදියට නෙමේ, ඒ පැත්තේ මිනිස්සු ඒ තීරණ ගත්තාවේ. නමුත් රජයේ වගකීම් තියෙනවා, මොකක්ද අපේ විදේශ ප්‍රතිපත්තිය, මොකක්ද අපේ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය, මොකක්ද මුල්‍ය පිළිබඳ ප්‍රතිපත්තිය? ඒවා මධ්‍යම රජය තීරණය කරන්න ඕන. ඉතින් ව්‍යවස්ථා

සම්පාදනය තුළ අපට කරන්න බොහෝ දේවල් තියෙනවා.

## මහජනයාත් වගකීම ගත යුතුයි

මේ අරගලයෙන් ආපු ඉල්ලීමක් තියෙනවා පාර්ලිමේන්තුවේ ඉන්න අය විතරක් නෙමේ ඒ අයත් මේකට සම්බන්ධ වෙන්න ඕන කියලා. ඒ අයගේ අදහසුත් ගන්න ඕනේ කියලා. මේක ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් නම් අපි පත් කරලා එවන අය ගැන අපට විස්වාසයක් තියෙන්න ඕන කියලා. කවුද ජාවාරම් කාරයෝ පත් කළේ? චෝදනාවක් තියනකොට, මිනීමරුවෙක් කියලා උසාවියකින් තීරණයක් දීලා තියෙනකොට වැඩි ඡන්දයෙන් පත් කළේ කවුද? එකට වග කියන්න ඕන 225 නෙමේ, එකට වග කියන්න ඕන ඡන්දේ දුන්න අය. අපි පුරවැසියන් හැටියට වගකීම ගන්න ඕනෑ, හැමදාම ඇඟිල්ල කොහාට හරි දිගු කරලා අපිට බේරෙන්නත් බැහැ. අපි හරි අයව එවන්නට ඕන. අපි දන්නවා මේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ දේශපාලන පක්ෂ සුදුසු මිනිස්සු දාන්නේ නෑ කියල, එක ඇත්ත. ඒ ක්‍රමය වෙනස් කරන්න ඕන, අපි බල කිරීමක් කරන්න ඕන. මේකට සුදුසු අය දාන්න, ඒ සඳහා සුදුසුකම් තියෙන්න ඕන කියලා. ඒවා සදාචාරාත්මක සුදුසුකම් වෙන්න පුළුවන්, නැත්නම් අධ්‍යාපන සුදුසුකම් වෙන්න පුළුවන්, හැකියාව පිළිබඳ වෙන්න පුළුවන්, ඒ අයව දාන්න කියලා බල කරන්න ඕන. නැත්නම් අපි අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තියෙන පක්ෂ හදලා, එවැනි පක්ෂ පාර්ලිමේන්තුව නියෝජන කරන්න ඕන. එකටත් ජනතාවට වගකීමක් තියෙනවා.

**21 වැනි සංශෝධනය ඉදිරිපත් කරන විට අපේ පක්ෂයෙන් කිව්ව දෙයක් තමයි, මහජන සභාවක් තියෙන්න ඕන කියලා. හැම කෙනෙක්ම දේශපාලනයට එන්නේ නැහැ, නමුත් තරුණ අය, කාන්තාවන්, විද්වතුන්, වෘත්තියවේදීන්, සිවිල් ක්‍රියාධරයින් ඇතුළත් වන සභාවක් තියෙන්න ඕන, ඒ අයට පුළුවන් උපදෙස් දෙන්න.**

ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේ ක්‍රමවේදයකුත් තියනවා. ලංකාවේ බොහෝවිට සිදුවෙන්නේ පවුල් දේශපාලනයක් නේ, සැමියාගෙන් පස්සේ බිරිඳ එනවා, නැත්තම් පුතා හෝ දුව එනවා, පවුලේ කෙනෙක් එනවා, ඒකත් වෙනස් කරන්න ඕන. ඒ අයට සුදුසුකම් තියේ නම් ගැටලුවක් නැහැ, සුදුසුකම් නැති ප්‍රශ්නයක් තමා තියෙන්නේ. එතකොට තමා ගැටලු එන්නේ. ව්‍යවස්ථා සම්පාදනය කියන එක කමිටුවක් පත් කරලා කැමති තුන් හතර දෙනෙකුට තීරණය කරන්න බැහැ. මහජන විමසීම් කරන්න ඕන. ඊට අමතරව පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් (Constitution eslambly) බවට හරවන්න ඕන. එහෙම හරවලා ඒ හරහා තමා අලුත් ව්‍යවස්ථාවක් එන්න ඕන.

21 වැනි සංශෝධනය ඉදිරිපත් කරන විට අපේ පක්ෂයෙන් කිව්ව දෙයක් තමයි, මහජන සභාවක් තියෙන්න ඕන කියලා. හැම කෙනෙක්ම දේශපාලනයට එන්නේ නැහැ, නමුත් තරුණ අය, කාන්තාවන්, විද්වතුන්, වෘත්තියවේදීන්, සිවිල් ක්‍රියාධරයින් ඇතුළත් වන සභාවක් තියෙන්න ඕන, ඒ අයට පුළුවන් උපදෙස් දෙන්න. ඒ සභාව කොහොමද හැදෙන්න ඕන කියන එක ගැනත් ප්‍රශ්නයක් තියෙනවා, අපි ඒ ගැනත් කල්පනා කරන්න ඕන. නමුත් ඒ අයටත් අවස්ථාව දෙන්න ඕන පාලන තන්ත්‍රය තුළට ඇවිල්ලා, ඒ අයගේ අදහස් ප්‍රකාශ කරන්න. අපි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන ක්‍රමයකට යා යුතුයි. ■

# මැතිවරණ ක්‍රමයේත් වෙනසක් අවශ්‍යයි

**දයාසිරි ජයසේකර**
පාර්ලිමේන්තු මන්ත්‍රී (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)



රට තුළ අද පවතින සන්දර්භය තුළ ඇත්ත වශයෙන්ම පළමු කාරණය තමා පාර්ලිමේන්තුවේ 225ම අවශ්‍ය නෑ කියන කාරණය. එතැනදී ප්‍රධානම අර්බුදය තමා මේක මේ ලංකාවේ ඉන්න සියලු දෙනාම කියන කාරණයක් නෙමේ, අරගල භූමියේ යම් පිරිසක් විසින් මතුකරපු කාරණයක්.

ඇත්තවශයෙන්ම මේ තියෙන්නේ නොම්මරයක ප්‍රශ්නයක් නෙමේ, තමන් පත් කරන නියෝජිතයා පිළිබඳ විස්වාසය, ගෞරවය, ඔහු හෝ ඇය ඇත්තවශයෙන්ම ගිහින් කරන්නේ මොකක්ද, පාර්ලිමේන්තුව තුළ කරන ක්‍රියා පටිපාටිය, මේ ගැන ගැටලුවක් විදියට තමයි මම එය දකින්නේ. දෙවැනි කාරණය තමයි අවුරුදු 74ක් තිස්සේ කරන දේශපාලනය එපා කියන කාරණය. අවුරුදු 74කින් නෙමේ මේ ප්‍රශ්නය ඇති වුණේ. 1977 විවෘත ආර්ථික ක්‍රමවේදයෙන් පසු ඇති වුණ තත්වයක් කියලයි මම මෙය දකින්නේ. 77ට පෙර තිබුණු ආණ්ඩුවල දූෂිතභාවය අඩුයි, පුද්ගලයන් දුෂ්ට නැහැ. අපි දන්නවා සී.ඩබ්.ඩබ්. කන්නංගර මහත්මයා මිය යනකොට ඔහු ගත්තේ පිං පඩියක්. එවැනි දේශපාලකයන්ගෙන් යුක්ත සමාජයක් තමයි 77 පස්සේ සමානුපාතික මැතිවරණ ක්‍රමයත් විවෘත ආර්ථික ක්‍රමයත් නිසා විශාල අර්බුදයකට ලක්වෙලා තියෙන්නේ. ඒ නිසා මම නම් විස්වාස කරන්නේ මේක අවුරුදු 40කට එහා දේශපාලන ඉතිහාසය එක්ක ඇති වුණ තත්ත්වයක්.

## ජාතික සභාවක් පිළිබඳ යෝජනාව

ඒ වගේම, මේ අරගල භූමියේම හිටපු අගෙන් ආපු ලොකු යෝජනාවක් තමයි, පාර්ලිමේන්තුව හා කැබිනට් මණ්ඩලයට සමගාමීව වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ජාතික සභාවක් ස්ථාපිත කරලා, ඔවුන්ගේ අදහස් උදහස් අරගෙන රාජ්‍ය පාලනය කළ යුතුයි කියන කාරණය. අපි යෝජනා කරලා තියෙන්නෙත් ඒකයි. ඔවුන් පාර්ලිමේන්තුව තුළට අපිව

පත් කර යවනවා වගේම අනෙක් පැත්තෙන් ඔවුන්ගේ අදහස් යෝජනා සලකා බලන යම් මණ්ඩලයක් තිබිය යුතුයි කියන කාරණය. මෙය එක්තරා විදියකට වටිනාකමක් සහිතව සාකච්ඡා කරමින් තිබෙන කාරණයක් විදියට අපි දකිනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදියට අපේ සංවිධායකවරුන් පත් කරන්නේ නායකයා නෙමේ. නායකයා ලියුම දුන්නට ඊට පෙරාතුව යම් වැඩසටහනක් තියෙනවා. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් තිබෙනවා, ඒ මණ්ඩලයට පුද්ගලයින් එනවා, ඔවුන්ගේ තොරතුරු සාකච්ඡා කරනවා, එමගින් තමයි අපි ඒ ඒ ආසනවලට සංවිධායකවරුන් තෝරා පත් කර ගැනීම කරන්නේ. පක්ෂයක නායකයකු විසින් පුද්ගලයකු පත් කිරීම සාධාරණ ක්‍රමයක් නෙමේ. මැතිවරණයකදී තමන් කැමති පුද්ගලයෙකුට ඡන්දය දෙන්න හොඳ ලයිතුවක් නැහැ කියන එක ජනතාවගෙන් එල්ලවන විශාල චෝදනාවක්. සමහර දිස්ත්‍රික්කවල ලයිතුව ගත්තම, හොරු, මංකොල්ලකාරයෝ, සමාජ දූෂණ චෝදනාවලට ලක් වෙච්ච අය, ත්‍රාඩයින්, රස්තියාදු කාරයින්, ඉගෙන ගත්තු නැති අය, මේ වගේ අයගේ නම් ගණනාවක් මේ ලයිස්තු තුළ

**මේ අරගල භූමියේම හිටපු අගෙන් ආපු ලොකු යෝජනාවක් තමයි, පාර්ලිමේන්තුව හා කැබිනට් මණ්ඩලයට සමගාමීව වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ජාතික සභාවක් ස්ථාපිත කරලා, ඔවුන්ගේ අදහස් උදහස් අරගෙන රාජ්‍ය පාලනය කළ යුතුයි කියන කාරණය. අපි යෝජනා කරලා තියෙන්නෙත් ඒකයි.**

තිබෙනවා. ඒක තමයි තියන ප්‍රධාන අර්බුදය, ජනතාවට තමන්ට කියල තෝරා ගන්න හොඳ මිනිස්සු මේ ලයිස්තුවේ නැහැ කියන එක.

## පිළිගත හැකි අපේක්ෂකයින් අවශ්‍යයි

දේශපාලන පක්ෂ විදියට අපි සියලු දෙනාට වගකීමක් තියනවා, රටේ සමාජයේ පිළිගැනීමට ලක් වන පුද්ගලයින් දාන්න. දූෂණ චෝදනාවලට ලක් වුණ අය, මිනීමැරුම් කරපු අය, මිනීමැරුම් චෝදනාවලට ලක් වුණ අය ලැයිතුවක් තුළින් ඉදිරිපත් කළාම සාධාරණ තෝරාගැනීමකට ඉඩක් ජනතාවට ලැබෙන්නේ නැහැ. ඒ සඳහා වන කරුණු ගණනාවක් අපි සාකච්ඡා කරගෙන යනවා.

ව්‍යවස්ථා සංශෝධනයක් යන කාරණයේදී, මේ කී දේවල්වලට සමගාමීව දැනට පවතින මැතිවරණ ක්‍රමයත් ප්‍රතිසංස්කරණය විය යුතුයි. ඒ ගැනත් අපි සාකච්ඡා කරමින් ඉන්නවා, අපේ යෝජනා ගණනාවක් ඉදිරිපත් කරලා තියනවා, අනාගතේ ඉතාම ඉක්මනින් මේ මැතිවරණ සංශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කළොත් පමණයි නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙන්නේ. අරගලය හා සම්බන්ධ වෙලා ඉන්න මිනිසුන්ගේ හැඟීම යම් විදියකට සන්තර්පණය කරන්න වෙන්නේ මේ ක්‍රියාවලිය තුළ කියලයි මම විස්වාස කරන්නේ. ■

# පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයත් තහවුරු කළ යුතුයි

**ආචාර්ය හරිනි අමරසූරිය**
පාර්ලිමේන්තු මන්ත්‍රීනී (ජාතික ජන බලවේගය)



මේ මොහොතේ ජාතික ජනබලවේගය හැටියට අපි දකින දෙයක් තමයි මේ පුරවැසි නැගිටීම, දේශපාලන අවදිවීමක් සමග අපේ රටට අත්‍යාවශ්‍ය වන දේශපාලන පරිවර්තන පිළිබඳව සාකච්ඡා වෙමින් යන මොහොතක්. විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ මහජන නියෝජිතයන් සහ පුරවැසියන් අතර තියෙන සම්බන්ධය ගැන නව අර්ථකථන අවශ්‍ය සහ ඒ ගැන සංවාදයක් මතු වී තිබෙන මොහොතක්. කොටින්ම කිව්වොත් පාලකයන් සහ පුරවැසියන් අතර අලුත් සමාජ සම්මුතියක් ඉල්ලන වෙලාවක්. ජාතික ජන බලවේගය හැටියට අපි කාලයක් තිස්සේ කතා කරන දෙයක් තමයි, අද තියෙන ව්‍යවස්ථාව තුළින් අපි එන්න පුළුවන් උපරිම දුර ඇවිල්ලා තියෙන්නේ. මෙය තව දුරටත් ප්‍රතිසංස්කරණය කිරීම තුළින් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කරන්නවත්, ශක්තිමත් කරන්නවත් බැහැ. ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් මේ ව්‍යවස්ථාව ගැන විවේචනත් බොහොමයක් තිබෙනවා. ඒ නිසා අපි අලුත් ව්‍යවස්ථාවක් තමයි යෝජනා කරන්නේ. අපි 2018 සිටම අලුත් ව්‍යවස්ථාවක් යෝජනා කළා, මූලික වශයෙන් ප්‍රශ්න කිහිපයක් ආමන්ත්‍රණය කිරීම සඳහා.

**අද තියෙන ව්‍යවස්ථාව තුළින් අපි එන්න පුළුවන් උපරිම දුර ඇවිල්ලා තියෙන්නේ. මෙය තව දුරටත් ප්‍රතිසංස්කරණය කිරීම තුළින් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කරන්නවත්, ශක්තිමත් කරන්නවත් බැහැ.**

## සමානාත්මතාව සහතික කිරීම

එකක්, අපේ ශ්‍රී ලාංකික පුරවැසියන් අරගල කළේ, මහන්සි වුණේ, සන්නද්ධ අරගල වැනි දේවල් හරහා පවා උත්සාහ කළේ, පාලකයාත් පුරවැසියාත් අතර මේ සමාජ සම්මුතිය හදා ගන්නයි. අවුරුදු ගණනාවකට පස්සෙත් ඒක හරියට වෙලා නෑ කියන එක පිළිගන්න වෙනවා. එය ගොඩනැගීම තමයි අපේ මූලික අරමුණ. අනෙක් අරමුණ තමයි සමානාත්මතාව සහ සමාජ සාධාරණත්වය තහවුරු කරන එක. එය ව්‍යවස්ථාවක් තුළ ඉතාම වැදගත් දෙයක්. එතැනදී, පුරවැසියන්ගේ විවිධ අනන්‍යතා පිළිගනිමින්, වෙනස්කොට සැලකිය නොහැකි විදියට අයිතිවාසිකම් තහවුරු විය යුතුයි. මානව අයිතිවාසිකම් පරිච්ඡේදය තුළත් පුද්ගල අනන්‍යතා පමණක් නොව කණ්ඩායම් අනන්‍යතාද ආරක්ෂා කළ යුතුයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය, ආගමික හා සංස්කෘතික අනන්‍යතා ආදිය ආරක්ෂා වන විදියේ ව්‍යවස්ථාවක් අවශ්‍යයි. මොකද අපිට පිළිගන්න වෙනවා අපේ සමාජය තුළ විවිධත්වයක් තිබෙන බව, ඒ විවිධත්වය තුළ දෙවැනි පන්තියේ පුරවැසියන් (Second Class Citizens) ඉන්න විදියක් නැහැ. සමානාතමතාව තහවුරු වෙන්න ඕන.

## පුරවැසියාගේ බලය වැඩි කිරීම

අනෙක් දේ තමයි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට නම් පුරවැසියාගේ බලය වැඩි වෙන්න ඕන. පරමාධිපත්‍ය බලය තියෙන්නේ පුරවැසියා සතුව තමයි, නමුත් අපට දැනට තියන ක්‍රමය අනුව පරමාධිපත්‍ය බලය පුරවැසියෙකුට පෙන්නන්න පුළුවන් වෙන්නේ හෝ අභ්‍යාස කරන්න පුළුවන් වෙන්නේ මැතිවරණයකදී විතරයි. අපි හිතනවා එය ප්‍රමාණවත් මදි කියලා. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරනවා නම්, පුළුල් කරනවා නම්, පුරවැසියෙකු පාලන ක්‍රියාවලිය තුළ මීට වඩා ශක්තිමත්ව, සක්‍රියව ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක ගැනත් සලකා බැලිය යුතුයි. ඒ ඔස්සේ අපිට යෝජනා කිහිපයක් තියනවා. මේවා අවසාන යෝජනා, අවසාන තීරණ නෙමේ, මේවා අපි සාකච්ඡා කරමින් යන්නේ. මම උදාහරණ දෙක තුනක් කියන්නම්,

මැතිවරණයකදී දේශපාලන පක්ෂ ඔවුන්ගේ මැතිවරණ ප්‍රකාශන ඉදිරිපත් කරනවා, පොරොන්දු ඉදිරිපත් කරනවා, බලයට පැමිණි විට කරන දේවල් සම්බන්ධයෙන්. අපි හිතනවා ඒවාට යම් කිසි වලංගුභාවයක් තියෙන්න ඕන කියල. ඒ මැතිවරණ ප්‍රකාශනවලට අනුව පත්වන ආණ්ඩුව ඒවා ක්‍රියාත්මක කිරීමට බැඳී ඉන්න ඕන. ඒ කාරණය ව්‍යවස්ථානුකූලව තහවුරු වෙන්න ඕන. යම් කිසි විදියකට පුරවැසියෙකුට, ඒ දුන්නු පොරොන්දු ඉෂ්ට කළේ නෑ කියලා, තමන්ගේ මානව හිමිකමක් කඩ වුණා කියලා උසාවි යාමේ හැකියාව තියෙන්න ඕන. එවිට දේශපාලන පක්ෂ බැඳිලා ඉන්නවා ඔවුන් ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශන, පොරොන්දු ඉටු කරන්න. අපි හිතනවා එවිට මැතිවරණ ප්‍රකාශන කල්පනාකාරීව ඉදිරිපත් වෙයි කියලා. කරන්න බැරි දේවල් පොරොන්දු වෙන්නේ නෑ වගේම මිනිස්සුන්ව අන්දන්න යන්නේ නෑ, බොරු පොරොන්දු දීලා. මොකද ව්‍යවස්ථානුකූලව පුරවැසියාට ඉඩක් තියනවා තමන්ගේ අයිතිවාසිකමක් උල්ලංඝනය කළා කියලා නඩු කියන්න.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය, ආගමික සංස්කෘතික අනන්‍යතා ආදිය ආරක්ෂා වන විදියේ ව්‍යවස්ථාවක් අවශ්‍යයි. මොකද අපිට පිළිගන්න වෙනවා අපේ සමාජය තුළ විවිධත්වයක් තියනවා, ඒ විවිධත්වය තුළ දෙවැනි පන්තියේ පුරවැසියන් ඉන්න විදියක් නැහැ.**

## යළි කැඳවීමේ බලය දිය යුතුයි

අපි හිතන තව දෙයක් තමයි 'නැවත කැඳවීමේ' බලය (Right to Recall) කියන කාරණය. ඒ කියන්නේ මැතිවරණයකදී පත්වෙන මහජන නියෝජිතයාගේ ක්‍රියාකලාපය ගැන, ඔහු හෝ ඇය පත්කරන පුරවැසියන්ට විවේචනයක් තියෙනවා නම්, ඔවුන් දූෂණයේ යෙදෙනවා නම්, පිළිගත නොහැකි ආකාරයකට හැසිරෙනවා නම් ඔවුන්ව නැවත කැඳවා ගැනීමේ බලය පුරවැසියන්ට තියෙන්න ඕන, පෙත්සමක් හෝ මැතිවරණයක් හරහා. අවුරුදු 05 අවසන් වෙනතුරු ඉන්න ඕන වෙන්නේ නැහැ. ඒ මහජන නියෝජිතයන් පත් කළ පුරවැසියන්ට පුළුවන් වෙන්න ඕන ඔහුව නැවත කැඳවන්න. අවුරුදු 5ක් ඕන දෙයක් කරන්න පුළුවන් වගේ හැඟීමකින් නේ අද මහජන නියෝජිතයන් පත් වෙන්නේ. ඔවුන් පොරොන්දු වෙච්ච දේ නෙමේ කරන්නේ. අනෙක් පැත්තෙන් මහජන මතයත් වෙනස් වෙලා. නමුත් පුරවැසියන්ට කරන්න දෙයක් නැහැ. අවුරුදු 5ක් බලන් ඉන්න ඕන. එවැනි තත්වයන් මග අරින්නත් අර අතර මැද කරන්න පුළුවන් දේවල් ගැනත් අපි අවධානය යොමු කරන්න ඕන.

පක්ෂවලින් එහාට මෙහාට පනින එක නවත්තන්න ඕන. එයින් සිදුවෙන්නේ ජනතාවෙ දුන්නු වරම අවභාවිත කිරීමක්. පත් කරන්නේ මොකක් හරි දෙයක් වෙනුවෙන්, නමුත් පත් කළාම ඕන පැත්තකට මාරු වෙනවා. මේවා ප්‍රජාතන්ත්‍ර විරෝධියි. මේවා ව්‍යවස්ථානුකූලව නවත්තන්න ඕන.

මේ වගේ යෝජනා කිහිපයක්ම අපට තියනවා, ඒ වගේම ව්‍යවස්ථානුකූලවත් පක්ෂ දේශපාලනය තුළත් සිද්ධවෙන්න ඕන තව දෙයක් තියෙනවා. අපි මේ වෙලාවේ ජාතික ජන බලවේගය හැටියට 'කොට්ඨාස සභා' පිහිටුවාගෙන යනවා. ඒ කොට්ඨාස සභාවලට පුළුවන් වෙන්න ඕන පක්ෂයේ ඉහළටම බලපෑම් කරන්න. පක්ෂය බලයට ආවත් ඒ ව්‍යුහය පාලන ක්‍රමය එක්ක සම්බන්ධ කළ හැකි විය යුතුයි. උදාහරණයක් හැටියට, මැතිවරණයකදී

**අපි හිතන තව දෙයක් තමයි Right to Recall කියන කාරණය. නැවත කැඳවීමේ බලය. ඒ කියන්නේ මැතිවරණයකදී පත්වෙන මහජන නියෝජිතයාගේ ක්‍රියාකලාපය ගැන, ඔහු හෝ ඇය පත්කරන පුරවැසියන්ට විවේචනයක් තියෙනවා නම්, ඔවුන් දූෂණයේ යෙදෙනවා නම්, පිළිගත නොහැකි ආකාරයකට හැසිරෙනවා නම් ඔවුන්ව නැවත කැඳවා ගැනීමේ බලය පුරවැසියන්ට තියෙන්න ඕන.**

පක්ෂයේ අපේක්ෂකයන් යෝජනා කරන්න පුළුවන් වෙන්න ඕන, ඒ කොට්ඨාස සභාවලට. කොට්ඨාස සභාව හරහා තමයි ඒ නාම යෝජනා ඉදිරියට යන්න ඕන. නැත්නම් උඩින් දාන එකක් වෙන්න බෑ. මේ ඔස්සේ පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත්, පුරවැසියන් මේ ක්‍රියාවලියට ශක්තිමත්ව සහභාගිවීමටත් අවස්ථාව ව්‍යවස්ථාපිතවම තහවුරු වෙන්න ඕන.

ඒ වගේම මේ දෙයත් කියන්න ඕන, ව්‍යවස්ථාවෙන් සියල්ල කරන්න බෑ, ව්‍යවස්ථාව කියන්නේ එකක්, පුරවැසි සහභාගිත්වය යථාර්ථයක් වීමට නම් පුරවැසියන් සංවිධානය වීමත්, දේශපාලන දැනුවත්භාවය ලබා ගැනීමත් අඛණ්ඩව සිද්ධ විය යුතුයි. ■

# අරගලයට කොටු වෙලා ව්‍යවස්ථා හැදුවොත් රටට හෙණ ගැහුව වගේ තියේවි

**ප්‍රසන්න රණතුංග**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)



අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 78 සිට මේ දක්වා 20 වතාවක් සංශෝධනය කර තිබෙනවා. මේ සංශෝධනවලින් බහුතරයක් ගෙනාවේ දේශපාලන පක්ෂ හෝ පුද්ගලයන්ගේ උවමනා එපාකම් ඉටු කරන්න. ඒ නිසා තමයි සංශෝධන ඇවිල්ලා ඇවිල්ලා මේක ව්‍යාකුල තත්වයකට පත්වෙලා තිබෙන්නේ. ඒ නිසා රටේ ජනතාවගේ, උගතුන්ගේ වියතුන්ගේ මතයක් තිබෙනවා, වර්තමානයට ගැළපෙන අලුත් ව්‍යවස්ථාවක් මේ රටට හඳුන්වා දෙන්න ඕන කියලා. ජනතාවගේ අවශ්‍යතා හඳුනාගෙන රටට ගැළපෙන අලුත්ම ව්‍යවස්ථාවක් ගෙන ආ යුතු බව තමයි මගේත් යෝජනාව.

ජනාධිපති ක්‍රමය අහෝසි කළාම පළාත් සභාවට මොකද වෙන්නේ, පළාත් සභාව පාලනය වෙන්නේ කාගේ යටතේද කියන

**ජනාධිපති ක්‍රමය අහෝසි කළාම පළාත් සභාව පාලනය වෙන්නේ කාගේ යටතේද කියන ගැටලුවත් මතු වෙනවා. මේවා එකකට එකක් බද්ධ වෙච්ච දේවල්. අපේ රට ෆෙඩරල් කරනවද, ඒකීය රටක් කරනවද කියන තීන්දුව ගන්න ඕන. ෆෙඩරල් කරනවා නම් පළාත් සභා තියලා ජනාධිපතික්‍රමය අහෝසි කළොත් ෆෙඩරල් විදියට යන්න පුළුවන්.**

ගැටලුවත් මතු වෙනවා. මේවා එකකට එකක් බද්ධ වෙච්ච දේවල්. අපේ රට ෆෙඩරල් කරනවද, ඒකීය රටක් කරනවද කියන තීන්දුව ගන්න ඕන. ෆෙඩරල් කරනවා නම් පළාත් සභා තියලා ජනාධිපතික්‍රමය අහෝසි කළොත් ෆෙඩරල් විදියට යන්න පුළුවන්. රටේ බහුතර ජනතාව කියනවා නම් මේක ඒකීය රජයක් වෙන්න ඕන කියලා, ජනාධිපතිට යම් බලතල තියෙන්න ඕන පළාත් සභා හසුරුවන්න. මේක කෙටියෙන් පැහැදිලි කරන්න බෑ, මේක පුළුල් සාකච්ඡාවක්. මම විපක්ෂයේ ඉද්දි හිටියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කමිටුවේ, අවුරුදු හතරක් අපි සාකච්ඡා කළා අවසානයක් දැක්කේ නෑ.


**අද අරගලය ගැන ලොකුවට මේ රටේ කතා වෙනවා. අරගලකරුවන් කියන්නේ 225ම එපා කියලා. හැබැයි මේ ඉන්න 225ම අයින් වුණොත් ඊළඟ පත් වෙන්නෙත් ලැයිස්තුවේ ඉන්න 225ක්. ඒ නිසා අරගලකරුවන්ගේ අරමුණ නෙමෙයි විය යුත්තේ.**

ව්‍යවස්ථාව කියන එක දින දෙකෙන් තුනෙන් හදන්න පුළුවන් දෙයක් නෙමේ. රටේ කතිකාවක් ඇති කරන්න ඕන. මොකද බොහෝ දෙනෙකුට මේ ව්‍යවස්ථාව ගැන අවබෝධයක් නැහැ. ඒ අයට ඕන එදිනෙදා අවශ්‍යතාව ඉටුකරගෙන ජීවත් වෙන්න. ඒ නිසා මම විශ්වාස කරනවා මේ රටේ කතිකාවක් ඇති කරලා, මේ පිළිබඳ වාද විවාද ඇති වන්න ඉඩ දීලා මේ රටට ගැළපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දිය යුතුයි කියලා. ඒ සඳහා සියලු දෙනාගේම සහයෝගය ලැබෙන්න ඕන. නැත්නම් මේක කරන්න බැහැ.

අද පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තුවෙන් පත්වුණ මන්ත්‍රීවරු හැරෙන්න අනෙක් සියලු දෙනාම ජනතාවගේ ඡන්දෙන්, ජනතාවගේ නියෝජිතයන් හැටියට තමයි පත් කරලා තියෙන්නේ. අද අරගලය ගැන ලොකුවට මේ රටේ කතා වෙනවා. අරගලකරුවන් කියන්නේ 225ම එපා කියලා. හැබැයි මේ ඉන්න 225ම අයින් වුණොත් ඊළඟ පත් වෙන්නෙත් ලැයිස්තුවේ ඉන්න 225ක්. ඒ නිසා අරගලකරුවන්ගේ අරමුණ නෙමෙයි විය යුත්තේ. එතන ඉන්න නායකයෝ හැට දෙනාගෙන් ඇහුවොත් මොකක්ද විය යුත්තේ කියල ඒ හැට දෙනා කියන්නේ හැට දෙයක්. ව්‍යවස්ථාව ගැන අවබෝධයක් නැති අයත් එතන කතා කරනවා. මාධ්‍ය ඇහුවම එයාලගෙන් මොනවද යෝජනා කරන්නේ කියල, එහෙම යෝජනා නැහැ කියනවා. ඒ නිසා මේ අරගලයට කොටු වෙලා ව්‍යවස්ථා හදන්න ගියොත් රටට හෙණ ගැහුවා වගේ තියේවි. මේ පිළිබඳ හොඳ අවබෝධයක් තිබෙන කණ්ඩායම් එකතු කරගෙන, හොඳ කතිකාවක් ඇති කරලා, ඒක ජනතාවගේ පැත්තෙන් බලලා ජනතාවගේ පරමාර්ථය රැකෙන පරිදි කටයුතු කරන ව්‍යවස්ථාවක් වෙන්න ඕන.

# පරණ ක්‍රමය පැත්තකින් තියලා අලුතෙන් හිතන්න ඕන

**එම්. ඒ. සුමන්තිරන්**
පාර්ලිමේන්තු මන්ත්‍රී (දෙමළ ජාතික සංධානය)



අරගලකරුවන් තදින්ම කියනවා මේ පවතින සමස්ත පාලන ක්‍රමයම වෙනස් විය යුතුයි කියලා. ඔවුන් මතු කරන සමහර කරුණු ඇත්ත බව අපටත් හැඟෙනවා. පවතින නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ නියෝජනය වෙන්නේ ජනතා මතයද? නැත්නම් ඒ ඒ නියෝජිතයින්ගේ මතය හෝ වෙනත් මතයක්ද කියන සාධාරණ සැකය අපි හැමදෙනාටම තියනවා.

මේ ක්‍රමය මුළුමනින්ම වෙනස් වීමට නම් අපට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි. ඒ මගින් වර්තමානයේ පවතින නියෝජිතයන් තෝරාගැනීමේ ක්‍රමය වෙනස් කළ යුතුයි. වර්තමානයේ සිද්ධ වෙන්නේ දේශපාලන පක්ෂ විසින් නියෝජිතයින් තෝරාගෙන ඔවුන් ජනතාවට ඉදිරිපත් කිරීමේ ක්‍රමයක්. මීට වෙනස් ව පැරණි ඡන්ද ක්‍රමයේ පැවතුණේ, ජනතාව තමන්ගේ අපේක්ෂකයා තෝරලා එම

**දැන් තිබෙන ක්‍රමය ඇතුළෙ අවුරුදු 05කට බලය දීලා නියෝජිතයින් පත්කර යැවුවට පස්සේ ඒ නියෝජිතයින් ගන්න තීරණවලට මැදිහත් වීමේ, බලපෑම් කිරීමේ හැකියාවක් ඔවුන් පත් කර යවන ජනතාවට නැහැ. අපේ රට අද පත් වී ඇති තත්ත්වයට මේ ක්‍රමය හේතුවක් වූ බව පේන්න තියනවා.**

අපේක්ෂකයා තමන්ගේ දේශපාලන පක්ෂයට ඉදිරිපත් කිරීමක්. පළාත් පාලන ආයතනවල ඒ වගේ ක්‍රමයක් තමයි තිබුණේ. ඡන්දයෙන් ඔහු තේරුණාට පස්සෙ ඒ සභාව තමයි රැස්වෙලා ආණ්ඩුවක් හදන්නේ කොහොමද කියලා තීරණය කරන්නේ. දැන් තියන ක්‍රමය අනුව වැඩි ඡන්ද හෝ වැඩි ආසන ගණනක් ගත්ත පක්ෂයට තමයි ආණ්ඩුවක් පිහිටුවීමේ බලය ලැබෙන්නේ.

මේ ක්‍රමය වෙනස් කරන්න නම් ජනතාව තමන්ගේ නියෝජිතයා තෝරලා ඉදිරිපත් කරලා, ඒ නියෝජිතයින් තේරී පත්වුණාට පස්සේ ඒ නියෝජිතයින්ගෙන් යුතු ආණ්ඩුවක් නැත්නම් කොමිටි ක්‍රමයක් හදන්න වෙනවා. දැන් මේ වගේ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදු වෙනවා.

## මහජන සභාව යනු කුමක්ද?

මහජන සභාව සම්බන්ධයෙනුත් මේ දිනවල යම් සාකච්ඡාවක් සිදු වෙනවා. මහජන සභාව කියන්නෙ මේ වගේ දෙයක්ඃ එතනදි වෙන්නේ වෙන් වෙන් මට්ටම්වලින් තෝරා පත්කරගන්නා නියෝජිතයින් ඉදිරි මට්ටම දක්වා ගමන් කරලා, ඒ වගේ නියෝජිතයින් එකතු වී පාර්ලිමේන්තුවක් නැත්නම් මහජන සභාවක් හැටියට ඒකතු වෙලා වගකීම් පවරා ගනිමින් පාලනය ඉදිරියට ගෙන යෑම.

මේ දේවල් කරන්න නම් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම වෙනස් කරලා, පවතින ක්‍රමය පැත්තකින් තියලා අලුත් විදියට හිතලා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට යන්න වෙනවා. මහජන සභාව ක්‍රියාත්මක වෙනව නම් රටට වැදගත් තීරණයක් ගැනීමට කලින් පහළම තියෙන මහජන ඒකකය ඒ ගැන සාකච්ඡා කරලා, ඒ ගන්නා තීරණය ඊට ඉහළින් තිබෙන ඒකකයට යොමු කරමින් අවසානයේ ඉහළම තිබෙන සභාවට යොමු කළ යුතුයි, මේක තමයි ජනතා මතය කියලා.

මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව තරමක් දුෂ්කර වුවත් දැන් අපේ රටට එවැනි ක්‍රමයක් අවශ්‍යයි කියන තැනට රට පැමිණිලා තිබෙනවා. මොකද දැන් තිබෙන ක්‍රමය ඇතුළෙ අවුරුදු 05කට බලය දීලා නියෝජිතයින් පත්කර යැවුවට පස්සේ ඒ නියෝජිතයින් ගන්න තීරණවලට මැදිහත් වීමේ, බලපෑම් කිරීමේ හැකියාවක් ඔවුන් පත් කර යවන ජනතාවට නැහැ. අපේ රට අද පත් වී ඇති තත්ත්වයට මේ ක්‍රමය හේතුවක් වූ බව පේන්න තියනවා. ඒ නිසා ජනතාවගේ මැදිහත්වීම හැම වැදගත් තීරණයක් ගන්නා අවස්ථාවකදීම පැවතීම තමයි මහජන සභාවක වැදගත්ම අංගය.


ජනතා නියෝජිතයින්ට දූෂණ චෝදනා එල්ල වෙද්දි, ජනතාවට හැකියාව තිබිය යුතුයි ඒ සම්බන්ධයෙන් කරුණු සොයා බලලා, ඒ ජනතා නියෝජිතයා එතැනින් ඉවත් කරලා වෙනත් කෙනෙක් එතැනට පත් කරන්න. ඒ වගේ යෝජනා මේ නව ව්‍යවස්ථාවට ඇතුළත් වුණොත් පමණයි ඒ ව්‍යවස්ථාව වඩා දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් වෙන්නේ.

මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම පහසු නොවුණත්, අපි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරනව නම් මේ අරමුණු ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් අපි නිර්මාණය කර ගත යුතුයි.

මේ කාරණයෙදි අපිට පුළුවන් යම් තාක්ෂණික සහයක් ලබාගන්න. මොකද නූතන ලෝකය දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම වෙනුවෙන් මේ වගේ ප්‍රායෝගික ගැටලුවලට පිළිතුරු සොයාගෙන තිබෙනවා. එහෙම නොවුණොත් වෙන්නේ දිගින් දිගටම ජනතා මතය විකෘති වීම.

# ව්‍යවස්ථා සංශෝධනයක් ඉක්මනින් සම්මත කළ යුතුයි

**රාවුෆ් හකීම්**
පාර්ලිමේන්තු මන්ත්‍රී (සමගි ජන බලවේගය)



රටේ ව්‍යවස්ථාමය වෙනසක් සිදු විය යුතුයි කියන මාතෘකාව ගෝල්ෆේස් අරගලයෙන් පසුව අලුත් අදියරකට පැමිණ තිබෙනවා. විශේෂයෙන්ම ව්‍යවස්ථාව තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුනු තුනක් හැටියට අපි හඳුන්වන විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතර සම්බන්ධය යම් තුලනයකින් යුතුව පවත්වාගෙන යෑම තමයි හොඳ ව්‍යවස්ථාවක ලක්ෂණයක් වන්නේ. ඒකත් එසේ රඳවාගෙන, ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් කිරීම උදෙසා වූ ප්‍රයත්නයක් දරනවා නම්, තිබෙන ව්‍යවස්ථාවේ ව්‍යුහය තුළ ඊට ක්‍රමවේදයක් තිබෙනවා. ඒ වගේම ව්‍යවස්ථාවෙන් පිට ජනතා සහභාගිත්වයෙන් කරනවා නම් ඒ සඳහාත් ක්‍රමවේදයන් තිබෙනවා.

දැනට පාර්ලිමේන්තුවේ නියෝජිත දේශපාලනඥයන් හැටියට තේරී පත් වී සිටින මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් අන්තර්වාර පාලනයක් ගැන සාකච්ඡා කරගෙන යනවා. එත් එක්කම දැනට සීමිත වශයෙන් අවශ්‍ය වූ ප්‍රතිපාදන කිහිපයක් කිරීමට ව්‍යවස්ථා සංශෝධනයක් දැනටම ඉදිරිපත් වී තිබෙනවා. එයට විධායකයේ ශක්තිය අඩු කරමින්, පාර්ලිමේන්තුවට තියන බලතල වැඩි කරන යෝජනා කිහිපයක් ඇතුළත්, කලින් තිබුණු 19 වැනි සංශෝධනයත් ඊට ඔබ්බට ගිය තවත් ප්‍රතිපාදන කිහිපයකුත් ඇතුළත් කිරීමට නියමිතයි. මේවා හරි ආකාරයට කළා නම් දැනට ජනතාව තුළ තියෙන විවාදය යම් දුරකට හෝ සමනය කළ හැකියි කියා බලාපොරොත්තු වෙනවා. නමුත් සම්පූර්ණයෙන්ම අලුත් ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා වූ තේරීම කාරක සභාවක් ඇති කරලා එතුළින් ව්‍යවස්ථාව සම්පාදනය කිරීමටත් උත්සාහයක් තිබෙනවා.

## අදියර කිහිපයකින් කළ යුතුයි

ඒ හැර මහජන සහභාගිත්වයෙන් කරනවා නම් මහජන මන්ත්‍රණ සභාවක් පාර්ලිමේන්තුවෙන් පිට ඇති කර, කලින් හැත්තෑ ගණන්වල කළා වගේ, එවැනි උත්සාහයකුත් ගත හැකියි. මේ සියලු දේවල් කිරීමට පෙර ලෝකයේ ව්‍යවස්ථා සම්පාදනයේදී සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රමවේද අපි අනුගමනය කළ යුතුයි. ඒ සඳහා වූ ප්‍රවේශයන් ගැනීම සඳහා ජනතාවගෙන් ඒ වරම ලබා ගැනීමට අවශ්‍යයි. තවත් මැතිවරණයකට යෑම ඔස්සේ තමයි එය කළ හැක්කේ. එකයි අපි බලාපොරොත්තු වෙන්නේ.

මේ ක්‍රමවේදයන් ඔස්සේ තුලනාත්මක, රටේ ජනතාවගේ වර්තමාන හැඟීම්වලට පිළිතුරු දෙන හරි ව්‍යවස්ථාවක්, විශේෂයෙන්ම කුලුනු තුනක් වන විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය අතරේ සම්බන්ධය තුලනාත්මකව ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. එය කිරීම සඳහා අදියර කීපයකින්, කෙටිකාලීන අදියරක් හැටියට 19 වැනි සංශෝධනයේ තිබුණු ප්‍රතිපාදන ඉදිරිපත් කරලා ඒ ඔස්සේ විධායකයට තිබෙන බලතල අඩු කරන්නත්, පාර්ලිමේන්තු බලතල වැඩි කරන්නත්, ඒ වගේම සහමුලින්ම ව්‍යවස්ථාව වෙනස් කරලා, මැතිවරණ ක්‍රමය ඇතුළු අනෙකුත් අවශ්‍යතාවන් ඇතුළත් වන ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීමටත් දැන් අවකාශයක් ඇති වෙලා තිබෙනවා.

**ඒ හැර මහජන සහභාගිත්වයෙන් කරනවා නම් මහජන මන්ත්‍රණ සභාවක් පාර්ලිමේන්තුවෙන් පිට ඇති කර, කලින් හැත්තෑ ගණන්වල කළා වගේ, එවැනි උත්සාහයකුත් ගත හැකියි. මේ සියලු දේවල් කිරීමට පෙර ලෝකයේ ව්‍යවස්ථා සම්පාදනයේදී සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රමවේද අපි අනුගමනය කළ යුතුයි.**

## විධායකයේ බලය සීමා කිරීම

පාර්ලිමේන්තුව තමන්ගේ කැමැත්ත පරිදි විසුරුවා හැරීමට විධායකයට තිබෙන බලතල අහෝසි කළ යුතුයි කියන උවමනාව තිබෙනවා. ඒ සඳහා වූ ප්‍රයත්නයක් දැරිය යුතුමයි. ඒ වගේම ව්‍යවස්ථාදායකයෙන් ඇමති මණ්ඩලයක් තෝරා ගැනීමේදීත් අගමැති පත් කිරීමේදීත් විධායකයට හිමිවෙලා තිබෙන අභිමතය අඩු කළ යුතුයි. නැත්නම් සම්පූර්ණයෙන්ම නැති කළ යුතුයි. ඒ කියන්නේ විධායක ජනාධිපති ධුරය ඉවත් කරලා පාර්ලිමේන්තුවේ බහුතරයෙන් පත් වෙන අගමැතිවරයෙකුට ඒ බලතල පවරන ව්‍යවස්ථා ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුයි කියන ඉල්ලීමක් තිබෙනවා. ඒ වගේම ඇමතිවරුන්ගේ බලතලත් නිශ්චිත වශයෙන් තීරණය කරන ක්‍රමවේදත් ඇතුළත් විය යුතුයි. නැත්නම් උවමනාව පරිදි අගමැතිට හෝ ජනාධිපතිට ඇමති මණ්ඩලය පුළුල් කිරීමට තියන අවකාශය අඩු කළ යුතුයි, සීමා කළ යුතුයි. ඊට අමතරව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සහ සිවිල් සමාජයේ ප්‍රවීණයන් එකතු වුණු ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ඔස්සේ වැදගත් තනතුරු සඳහා පත්වීම් විනිවිදභාවයකින් යුතුවත්, සුදුස්සන් පත්වන ආකාරයටත්, ප්‍රවීණයන් ඒ තැන්වලට එන ආකාරයටත්, ජනතා අයිතිය සුරකින යම් ක්‍රමවේදයක් අවශ්‍යයි කියන ඉල්ලීමකුත් තිබෙනවා. මේ වගේ සංශෝධන රාශියක් ඇතුළත් වූ අලුත් ව්‍යවස්ථා සංශෝධනයක් ඉතාම ඉක්මනින් අපි සම්මත කළ යුතුයි.

# අලුත් ව්‍යවස්ථාවක් ගේන්න මේ පාර්ලිමේන්තුවට බැහැ

**මනෝ ගනේෂන්**
පාර්ලිමේන්තු මන්ත්‍රී (සමගි ජන බලවේගය)



අප ඉදිරියේ ජන රජයක් හැටියට මාර්ග දෙකක් තිබෙනවා. එකක්, ව්‍යවස්ථාවට සංශෝධන එකතු කිරීම, අනික මුළුමනින්ම අලුත් ව්‍යවස්ථාවක් ගෙන ඒම. මේ පාර්ලිමේන්තුව තුළ අලුත් ව්‍යවස්ථාවක් ගෙන්න බැහැ. ව්‍යවස්ථාවක් ගෙන ඒමේ ක්‍රියාවලිය සම්මත වෙන්න ඕන පාර්ලිමේන්තුවෙන්. ජනමත විචාරණයකට යන්න පුළුවන් වුණත් පාර්ලිමේන්තුව තමයි මූලික වෙන්නේ. මේ පාර්ලිමේන්තුව විකෘති වුණ පාර්ලිමේන්තුවක්. එළියේ තියෙන ජන මතය පාර්ලිමේන්තුව තුළ ප්‍රදර්ශනය වෙන්නේ නැහැ. නියෝජනය වෙන්නේ නැහැ. එය කවුරුත් දන්නවා. දැන් කරන්න පුළුවන් දේ තමයි සංශෝධන.

20 වතාවක් ව්‍යවස්ථාව සංශෝධනය කරලා තියෙනවා. ඊළඟ සංශෝධනය අංක වශයෙන් ගත්තම 21. දැන් අපි ඒගැන පොඩ්ඩක් දන්නවා, මොකද මීට පෙර 19 තිබුණා.

**17 දී තමයි පළමු වතාවට පක්ෂ සහ සිවිල් සංවිධාන එකතු වෙලා ව්‍යවස්ථාවට ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ගෙනාවේ. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් එය මුළුමනින්ම අහෝසි කළා, රාජපක්ෂ ආණ්ඩුව. අපිත් ආයේ අනාරින්නැතුව 19 ගෙනාවා. නැවත රාජපක්ෂලා ඇවිත් 20 ගෙනාවා. 17ට, 19ට අත උස්සපු කෙනෙක් තමා මම. ඒ වගේම 18 හා 20ට විරුද්ධ වුණ කෙනෙක්.**

ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ව්‍යවස්ථාවට ගෙනාවා. ඊට පෙර 18 තිබුණා. ඊට පෙර 17 තිබුණා. 17 දී තමයි පළමු වතාවට පක්ෂ සහ සිවිල් සංවිධාන එකතු වෙලා ව්‍යවස්ථාවට ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ගෙනාවේ. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් එය මුළුමනින්ම අහෝසි කළා, රාජපක්ෂ ආණ්ඩුව. අපිත් ආයේ අතාරින්නැතුව 19 ගෙනාවා. නැවත රාජපක්ෂලා ඇවිත් 20 ගෙනාවා. 17ට, 19ට අත උස්සපු කෙනෙක් තමා මම. ඒ වගේම 18 හා 20ට විරුද්ධ වුණ කෙනෙක්. අපේ පක්ෂ ස්ථාවරය එයයි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය ගැන, ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පාර්ලිමේන්තුවට ගෙන්න ඕන කියලා කතා කරන්නට, කාටත් වැඩිය මටත් මගේ පක්ෂයටත් අයිතිය තියෙනවා කියල මම හිතනවා.

## ජාතික ප්‍රශ්නයට විසඳුම් අවශ්‍යයි

පක්ෂ තුළ ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපි කතා කරනවා. අපේ පක්ෂය සාපේක්ෂව බලන කොට අපේ තීන්දු තීරණ ගන්න මණ්ඩලයේ වෙන කාටත් වඩා ප්‍රජාතන්ත්‍රවාදය තියනවා කියලා මම හිතනවා. පක්ෂ නායකයා හැටියට මම ඒක විස්වාස කරනවා. අනෙක් කාරණය තමයි මේ ව්‍යවස්ථාවට නැවත 19 විතරක් ගෙනල්ලා එතනින් අවසන් කරන්න බැහැ. දෙමළ ජනයා හැටියට අපි යටපත් වෙච්ච ජන කණ්ඩායමක් නියෝජන කරන පක්ෂයක්. ජාතික ප්‍රශ්නයට විසඳුම් හොයල නැහැ කවුරුවත්. ව්‍යවස්ථාව තුළ 13 ව්‍යවස්ථා සංශෝධනය තියනවා, නමුත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒකට එහා යන්න ඕන. 13+ විය යුතු බව අපි කිව්වත්, දැන් තර්ටීන් මයිනස් වෙලා තියෙන්නේ. ඒවා ගැනත් අවධානය යොමු කරන්න ඕන.

**සිවිල් සමාජය හිතනවා නම් ස්වාධීන කොමිසම්, යහපාලනය, නීතියේ පාලනය, මාධ්‍ය නිදහස, පොලිසියේ සහ අධිකරණයේ ස්වාධීනත්වය ගෙනාවම ඔක්කොම හරි කියලා, එක හරි නැහැ. මේ ඔක්කොම ඕන, අපි එතැන ඉන්නවා. නමුත් ඊට එහා ගිහිල්ලා ජාතික ප්‍රශ්නයට විසඳුම සොයන්න ඕන.**

සිවිල් සමාජය හිතනවා නම් ස්වාධීන කොමිසම්, යහපාලනය, නීතියේ පාලනය, මාධ්‍ය නිදහස, පොලිසියේ සහ අධිකරණයේ ස්වාධීනත්වය ගෙනාවම ඔක්කොම හරි කියලා, එක හරි නැහැ. මේ ඔක්කොම ඕන, අපි එතැන ඉන්නවා. නමුත් ඊට එහා ගිහිල්ලා ජාතික ප්‍රශ්නයට විසඳුම සොයන්න ඕන. අද මොකද වෙලා තියෙන්නේ? මේ අර්බුදයට මූලික හේතුව වෙන්නේ ජාතික ප්‍රශ්නය තමයි. ප්‍රශ්න අවසන් වෙලා නැහැ, යුද්ධය තමයි අවසන් වෙලා තියෙන්නේ. ඒ යුද්ධයට විසාල මුදල් කන්දරාවක් වියදම් කරන්න සිදු වුණා. සංවර්ධනයට සහ ජනතාවගේ ප්‍රශ්නවලට භාවිත කළ යුතු මුදල් ඊට වැය වුණා. ඒ විතරක් නෙමේ, යුද්ධය දින්නා කියන කාරණාව උඩ රාජපක්ෂලාට ඕන දෙයක් කරලා යන්න කියල අවස්ථාව දුන්නා. හොරකම් කරන්න, මිනී මරන්න, පැහැරගෙන යන්න, මාධ්‍යවේදීන්ට ගහන්න, සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ගහන්න, මරල දාන්න කියල ඕන විදියේ දෙයක් කරන්න ජනතාව ලයිසන් එකක් දුන්නා. ලක්ෂ 69 තමා රාජපක්ෂලා ගෙනාවේ, දැන් උද්ඝෝෂණ අරගල කරන්නෙත් ඒ අය තමයි. 'ගෝටා ගෝ හෝම්' කියල දැන් කියනවා. මම ඔක කිව්වේ 2004දී සුදු වෑන්වලින් පැහැරගෙන යනකොට.

## සමානුපාතික හා මනාප ක්‍රමය තිබිය යුතුයි

අපි එහෙම කියල අයින් වෙන්නේ නෑ. එකතු වෙලා අත්වැල් බැඳගෙන ඉන්නවා. දැන් අරගලයට විරුද්ධව ඇතිවෙලා තියන මර්දනය අපි හෙළා දකිනවා. ඊට විරුද්ධ වෙනවා.

ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ඕන කියල මතයක් තියනවා. ඒත් දැන් තියෙන සමානුපාතික ක්‍රමය වෙනස් කරනවට අපි එකඟ වෙන්නේ නැහැ කවදාවත්. සිවිල් සමාජය පාඩමක් ඉගෙන ගන්න ඕන. සිවිල් සමාජයේ වැරදි මිථ්‍යාවක් තියෙනවා, ඒ වගේම මනාප ක්‍රමය අහෝසි කරන්න ඕන කියල කතාවක් තියෙනවා. පක්ෂයෙන් 20 දෙනෙක් ඉදිරිපත් වෙනවා නම්, තුන් දෙනෙක් තෝරලා එවන්න පුළුවන් ජනතා මනාපයෙන්. එය ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක්. සමානුපාතික ක්‍රමය නිසා තමා සුළු පක්ෂවලට පාර්ලිමේන්තු එන්න අවස්ථාව තියෙන්නේ. එහෙම නැත්නම් පක්ෂ දෙකක් විතරයි පාර්ලිමේන්තු එන්නේ. ඒක තවත් ඒකාධිපති වියරුවක්. එක තේරුම් ගන්න ඕන. දැන් අරගලකරුවෝ ඉන්නවා, තරුණයෝ ඉන්නවා. කොහොමද ඒ අය පාර්ලිමේන්තුවට එන්නේ? මේ ක්‍රමය හරහා තමයි අවස්ථාව තියෙන්නේ.

අලුත් ව්‍යවස්ථාවක් ගේන්න කාලයක් නැහැ. දැන් හැමෝම එකතු වෙලා නිශ්චිතව 19 වැනි සංශෝධනය ගෙනැල්ලා, 20 අහෝසි කරලා ඉතා ඉක්මනින් මැතිවරණයකට යමු. අලුත් ජනවරමක් ලබා ගනිමු, අලුත් මන්ත්‍රීවරු ඒවි, අර අරගල සහෝදරවරුන්ටත් එන්න පුළුවන්, ඇවිත් අපි ඔක්කොම එකතුවෙලා අලුත් ව්‍යවස්ථාවක් හදමු. කොහොමත් මේ පාර්ලිමේන්තුව එක්ක ඒක කරන්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ 134ක් ඡන්දෙ දීලා රාජපක්ෂලාගේ නියෝජිතයා ජනපති කරනවා. ජනතාව කියන්නේ එකද? ඒක විහිළුවක්, ඒ නිසා මේ විහිළුකාර පාර්ලිමේන්තුව තුළ අලුත් ව්‍යවස්ථාවක් බලාපොරොත්තු වෙන්න බැහැ.

**දැන් හැමෝම එකතු වෙලා නිශ්චිතව 19 වැනි සංශෝධනය ගෙනැල්ලා, 20 අහෝසි කරලා ඉතා ඉක්මනින් මැතිවරණයකට යමු. අලුත් ජනවරමක් ලබා ගනිමු, අලුත් මන්ත්‍රීවරු ඒවි, අර අරගල සහෝදරවරුන්ටත් එන්න පුළුවන්, ඇවිත් අපි ඔක්කොම එකතුවෙලා අලුත් ව්‍යවස්ථාවක් හදමු.**

## 225ම එපා කීම වැරදියි

හැබැයි එකක් කියන්න ඕන, අර 225ම එපා කියන කතාව නම් වැරදියි. මම 225න් එක්කෙනෙක්. මම හොරෙක් නෙමේ, මම වැරදි වැඩ කරල නැහැ, කුණුහරුප කතා කරලා නැහැ, කොමිස් ගහල නැහැ, මගේ ජනතාව වෙනුවෙන් පෙනී සිටිනවා පමණයි. මගේ ජනතාව මට ඡන්දය දුන්නේ, අරගල කරන මිනිස්සු නෙමේ. ඉතින් අපිට කොහොමද යන්න කියන්නේ? ප්‍රජාතන්ත්‍රවාදී කාසියේ දෙපැත්තක් තිබෙනවා, එක පැත්තක ඡන්ද ලබා ගන්න අය, අනෙක් පැත්තේ ඡන්ද දෙන අය. ඡන්ද ලබා ගන්න අය වැරදි කරනවා නම් උද්ඝෝෂණය කරලා යවන්න පුළුවන්නේ. ඒ වගේම ඡන්දේ දෙන ජනතාවත් හැදෙන්න ඕන, දේශපාලන වශයෙන් තේරුම් ගන්න ඕන, හොයල බලන්න ඕන, හරි එක්කෙනාට ඡන්දේ දෙන්න ඕන, එහෙම දුන්නොත් හරි, නැත්නම් ලබන මැතිවරණයේදීත් මේ වගේ තව සෙට් එකක් ඡන්දේ දීලා පාර්ලිමේන්තුවට යවයි. ඒ නිසා ජාතිවාද, අන්තවාද, බෙදුම්වාද, ත්‍රස්තවාද පදනම් කරගෙන, මුදල් අරගෙන ඡන්දේ දෙන එක නවත්තලා, තමන්ගේ රට ගැන හිතලා ඡන්දය පාවිච්චි කරන්න ඕන. අවංකකම තියෙන, කැප කිරීම තියෙන, දැක්මක් තියෙන, ජනතාවට ආදරය කරන, අඩුම තරමේ මේ බහු ජාතික රටේ භාෂා දෙකක් හරි කතා කරන්න පුළුවන් හැකියාවක් තියන අපේක්ෂකයෙකුට ඡන්දය දීලා පත් කරන්න ඕන. එවිට සුභවාදී අනාගතයක් ඇති වේවි. එහෙම නැතුව එක පැත්තකට විතරක් දොස් කියලා වැඩක් නැහැ. ■

# සංවර්ධනය සඳහාත් ව්‍යවස්ථාපිත තුලනයක් අවශ්‍යයි

**පාඨලී චම්පික රණවක**
පාර්ලිමේන්තු මන්ත්‍රී (සමගි ජන බලවේගය)



නව ව්‍යසවස්ථාවක් පිළිබඳ අදහස නැවතත් මතුවෙලා තියෙනවා. එයට හේතුව 2022 අප්‍රේල් 12 වෙනිදා රාජ්‍ය බන්කොලොත්භාවය ප්‍රකාශයට පත් කිරීම. මේ නිසා ජනතාවට මුහුණ පාන්න වෙලා තියෙන ප්‍රශ්න එක්ක තමන්ගේ නියෝජිතයින්  හා පාලකයින් බරපතළ ලෙස ප්‍රශ්න කරන්න පෙළඹිලා තිබෙනවා. ඒ නිසාම පාර්ලිමේන්තුවෙන් පිටත ඍජු ප්‍රජාතන්ත්‍රවාදය නියෝජනය වන ආකාරයේ නියෝජන ක්‍රමයක් පිළිබඳව සාකච්ඡාවකුත් සමාජයේ ඇති වී තිබෙනවා. ලංකාවේ අර්බුදය ගත්තහම ඊට යම්කිසි ඓතිහාසික කාරණයක් තිබුණත් මේ අර්බුදය මේ තැනට මෝරා වැඩුණේ 2010න් පසු අප විසින් ගන්නා ලද වාණිජ නොවන ණය කිසිම ආදායමක් ඉපයිය නොහැකි

**මේ අර්බුදය මේ තැනට මෝරා වැඩුණේ 2010න් පසු අප විසින් ගන්නා ලද වාණිජ නොවන ණය කිසිම ආදායමක් ඉපයිය නොහැකි ව්‍යාපෘතිවලට ආයෝජනය කිරීමත් ඉන් අතිවිශාල ධනස්කන්දක් මංකොල්ල කෑමත් නිසා. ඒක ගැටලුවක්ද යන ප්‍රශ්නය අප ඉදිරියේ තිබුණත්, ඒ පිටුපස ආණ්ඩුකරණය පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා.**

ව්‍යාපෘතිවලට ආයෝජනය කිරීමත් ඉන් අතිවිශාල ධනස්කන්දක් මංකොල්ල කෑමත් නිසා. ඒක ව්‍යවස්ථාවේ ගැටලුවක්ද යන ප්‍රශ්නය අප ඉදිරියේ තිබුණත්, ඒ පිටුපස ආණ්ඩුකරණය (Governance) පිළිබඳ ප්‍රශ්නය අප ඉදිරියේ පැන නැගී තිබෙනවා. බොහෝ දුරට අතීත ව්‍යවස්ථාවලින් සුළු ජාතික ජනතාවගේ දුක් ගැනවිලි හෝ අභිලාෂයන් පිළිබඳ කතා කළාට දැන් ඊට වඩා පුළුල් ක්ෂේත්‍රයක ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ ආර්ථික හැසිරීම් පිළිබඳ කාරණා සාකච්ඡාවට ගැනීමට ඉඩකඩ පුළුල්වෙලා තිබෙනවා.

## සංවර්ධන ක්‍රියාදාමයන් නියාමනය

සාමාන්‍යයෙන් ව්‍යවස්ථාව පිළිබඳ දේශපාලන විද්‍යාවේ අර්ථ දැක්වීම්වලට අනුව ආර්ථිකය පිළිබඳ කරුණු ව්‍යවස්ථාව තුළ නිරූපණය වෙන්නේ නැහැ. ඒවා නිරූපණය වන්නේ අණපනත්වලින්. නමුත් දැන් තියන තත්ත්වය යටතේ, එක් එක් පාලකයාට හිතුමනාපේ තීරණ ගැනීමට ඉඩ නොදෙමින්, යම් ව්‍යවස්ථාපිත තුලනයක් සංවර්ධනය යන කාරණයේදීත් ඇති කර ගත යුතුය කියන අදහස මතුවෙලා තියෙනවා. අපිත් යෝජනා කරලා තිබෙනවා ජාතික භෞතික සැලසුම, ඒ කොමිසම ව්‍යවස්ථාවට ඇතුල් කරලා ඉන් පිටත සංවර්ධන ක්‍රියාදාමයන් වැළක්වීමට කටයුතු කළ යුතුයි කියලා.

ඊට අමතරව සාම්ප්‍රදායික පක්ෂ දේශපාලනය බරපතළ විදියට ප්‍රශ්න කරලා තිබෙනවා. අපේ රටේ විප්ලවකාරී දේශපාලනයේ නියැලිච්ච අය නිතර බලාපොරොත්තු වුණා සන්නද්ධ අරගලයකින් ක්‍රමය පෙරළා දාන්න, වෙනස් ආකාරයක සමාජ ක්‍රමයක් ස්ථාපිත කරන්න. ඒවා අසාර්ථක වුණා, ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය පමණක් නොවේ ලංකාවේ අසාර්ථක වෙලා තියෙන්නේ, බරපතළ විදියට සන්නද්ධ දේශපාලනයත් අසාර්ථක වෙලා තියෙනවා. ඒ වගේම සන්නද්ධ දේශපාලනය විසින් ගොඩනගන්න හදපු සමාජවාදය වැනි දෑ, කියුබාව වගේ රටවල් දිහා බැලුවම ඉතා බරපතළ විදියට අභියෝගයට ලක් වෙලා තියෙනවා. එම සමාජ ක්‍රමයන් බිඳ වැටිලා තිබුණත් තවමත් ඒ මතකයන් කරපින්නාගත් පිරිස් ඉන්න හින්දා ඒ ගැටලුව ඇවිත් තිබෙනවා.

## පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය

ඒ නිසා තමන් අනුගමනය කරන ආර්ථික ක්‍රමය කුමක්ද කියන එක ගැන පමණක් නෙමෙයි, පක්ෂ ක්‍රමය සහ පක්ෂ නායකයින්ට ලැබී තිබෙන අසීමිත බලතල, පක්ෂ ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිවීම, පරාජයට පත් වූ විට ඉවත් වී නොයන ගතිය, නැවත නැවතත් පාර්ලිමේන්තුවට, පළාත් සභාවට හෝ ප්‍රාදේශීය සභාවට රිංගා ගැනීමට දරන හිරිකිත වෑයම, ඒ වගේම මේ රටේ පවුල්වාදය විසින් ඇති කර තිබෙන බලපෑම ආදිය ගැනද අවධානය යොමු විය යුතුයි. දැන් පාර්ලිමේන්තුවේ තුනෙන් එකක් ඥාතීන්, තව පිරිසක් පාදඩ සල්ලිවලින් මනාප වැඩි කරගෙන පැමිණි අය. ඒ වගේම මාධ්‍ය විසින් කරන ලද බලපෑම, විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික මාධ්‍ය අයිතිකරුවන් තමන්ගේ පිරිස් පාර්ලිමේන්තුවට යැවීම සඳහා විශාල මෙහෙයුමක් දියත් කරන අතර තමන් අකමැති අය පරාජය කිරීම සහ අපකීර්තියට පත් කිරීමේ ක්‍රියාවලියකුත් මෙහෙයවනවා. මේ මාධ්‍ය සහ

**ජනමාධ්‍ය ගත්විට, විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික මාධ්‍යවල සංඛ්‍යාත අයිති ජනතාවට. ඒවා ඉතාම කැත විදියට, ජනතාව නොමග යැවීමටත්, තමන් අකමැති පුද්ගලයින් අපකීර්තියට පත් කිරීමටත්, තමන්ගේ පිරිසක් ගෙන ඒමටත් යොදා ගැනෙනවා.**

පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව විශාල කතිකාවතක් දැන් ආරම්භ විය යුතුව තිබෙනවා.

**මුදල් වියපැහැදම් කිරීම පිළිබඳ නිශ්චිත පාලනයක් මැතිවරණ කොමිසමට ලැබිය යුතුයි. බොහෝ වෙලාවට මේ සඳහා අවධානය යොමු කරන්නේ රාජ්‍ය දේපොළ ගැන පමණයි. රාජ්‍ය දේපොළ පමණක් නෙමේ අයථා ලෙස උපයන ධනය යොදා ගෙන කරන මැතිවරණ ව්‍යාපාරවලටත් නිශ්චිත නීති රීති පැනවීමට මැතිවරණ කොමිසමට බාර කළ යුතුයි.**

## ජනමාධ්‍ය සහ පාදඩ ප්‍රාග්ධනය

ජනමාධ්‍ය ගත්විට, විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික මාධ්‍යවල සංඛ්‍යාත අයිති ජනතාවට. ඒවා ඉතාම කැත විදියට, ජනතාව නොමග යැවීමටත්, තමන් අකමැති පුද්ගලයින් අපකීර්තියට පත් කිරීමටත්, තමන්ගේ පිරිසක් ගෙන ඒමටත් යොදා ගැනෙනවා. ඒ වගේම මත්ද්‍රව්‍යය ජාවාරමෙන් වෙන්න පුළුවන්, කළු ගල්, පස් ජාවාරමෙන් වෙන්න පුළුවන්, රජයේ කොන්ත්‍රාත්වලින් වෙන්න පුළුවන්, මේ ආදී විදියට උපයන බිලියන ගණන් පාදඩ ධනය මැතිවරණවලදී ආයෝජනය වෙනවා. ඒ අය ඉහළ මනාප ලබා ගන්නවා. ඒ අය අද පාර්ලිමේන්තුවේ මුල් පෙළේ වාඩිවෙලා ඉන්නවා. මෙවැනි තත්වයන් එක්ක ප්‍රජාතන්ත්‍රවාදය, මහජන ඡන්දයේ වටිනාකම විහිළුවක් බවට පත්වෙලා තිබෙනවා. මේ පවුල්වාදය, පාදඩවාදය හා මාධ්‍ය බෝනික්කන් විසින් නටවන දේශපාලනය වෙනුවට ජනතාවගේ සැබෑ නියෝජිතත්වයක් ඇති කර ගැනීමට මේ ව්‍යවස්ථාවේ පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයත්, බාහිර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියත්, මැතිවරණ ක්‍රියාවලියත් ශක්තිමත් කළ යුතුව තිබෙන බව තමයි අපගේ විශ්වාසය.

අපේ අදහසේ හැටියට මැතිවරණ කොමිසම බලාත්මක කළ යුතුයි. මැතිවරණ කොමිසම එක පැත්තකින් පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය නැති ව්‍යවස්ථාවන් ප්‍රතික්ෂේප කළ යුතුයි. ඒ වගේම නිශ්චිත සම්ප්‍රදායක් රට තුළ ඇති කර ගත යුතුයි, මැතිවරණ පරාජයෙන් පස්සේ ප්‍රධාන නායකයින් ඉවත් වෙලා අනෙක් නායකයින් බලයට පත්වීමේ ප්‍රජාතාන්ත්‍රික වටපිටාවක් සකස් කර ගැනීමට. ඒ වගේම අපේක්ෂකයින් තෝරා ගැනීමේදී පක්ෂවල ප්‍රාදේශීය පිරිස්වල කැමැත්ත පිළිබඳ කාරණය ඉදිරියට ගන්න හැකියාවක් ළඟා කර ගත යුතුයි. ඇතැම් රටවල අපේක්ෂකයින් සඳහා ප්‍රාථමික මැතිවරණ පවත්වලා ඒ ඔස්සේ තමයි අපේක්ෂකයින් තෝරා ගන්නේ. එහෙම නැත්නම් ජනාධිපති අපේක්ෂකයින්, අග්‍රාමාත්‍ය අපේක්ෂකයින් තෝරා ගන්නේ. එවැනි ක්‍රමයක් අපටත් ඉතාම අවශ්‍යයි.

## මැතිවරණ වියදම් පාලනය

දෙවැනි එක මුදල්. මුදල් වියපැහැදම් කිරීම පිළිබඳ නිශ්චිත පාලනයක් මැතිවරණ කොමිසමට ලැබිය යුතුයි. බොහෝ වෙලාවට මේ විෂයේදී අවධානය යොමු කරන්නේ රාජ්‍ය දේපොළ ගැන පමණයි. රාජ්‍ය දේපොළ පමණක් නෙමේ අයථා ලෙස උපයන ධනය යොදා ගෙන කරන මැතිවරණ ව්‍යාපාරවලට නිශ්චිත නීති රීති පැනවීමට මැතිවරණ කොමිසමට බාර කළ යුතුයි. ඒ වගේම ජනමාධ්‍ය සම්බන්ධයෙන්, මුද්‍රිත මාධ්‍ය ගැන කිසියම් ආකාරයක ප්‍රශ්නයක් තිබුණත් රටේ විශාල වශයෙන් භාවිත වන

මාධ්‍ය වන්නේ විද්‍යුත් මාධ්‍යයයි. ඒ විද්‍යුත් මාධ්‍යවල සංඛ්‍යාත අයිති රටේ මහජනතාවට. අන්තර්ජාලය අයිති ජනතාවට. ඒ නිසා අන්තර්ජාලයත්, විද්‍යුත් මාධ්‍යයත් නිශ්චිත පාලනයකට, සමබර ආකාරයට පවත්වා ගැනීමට මැදිහත්වීම සඳහා මැතිවරණ කොමිසමට ඒ බලය පැවරීම අත්‍යවශ්‍යයි. නැත්නම් මේක ඉතාම දූෂිත ආකාරයට ක්‍රියාකරමින් යනවා.

ඒ වගේම මහජනතාවත් ව්‍යවස්ථාවෙන් පිටත යම් සම්ප්‍රදායක් ගොඩනගා ගත යුතුයි. දැන් රට බංකොලොත් වුණාට පසු 'අනේ අපිට මොකද වුණේ, කවුද මේවට වගකිව යුත්තේ', කියනවට වඩා කලින් ඉඳන්ම යම් ආකාරයක අවබෝධයකින් ක්‍රියා කළා නම් මේ ව්‍යසනය වෙන්නෙ නෑ. ඒ නිසා මහජනයාත් මේ සම්ප්‍රදායන් තේරුම් ගත යුතුයි. විශේෂයෙන්ම ජනාධිපතිවරණයක් ඉල්ලුවට පස්සේ අපේක්ෂකයෙක් ජයග්‍රහණය කළා නම් ඔහු එම තනතුර දැරීමෙන් පස්සෙ දේශපාලනයෙන් විශ්‍රාම යන, අපේක්ෂකයෙන් පරාජය වුණා නම් ඔහු දේශපාලනයෙන් විශ්‍රාම යන, ප්‍රධාන මැතිවරණ පරාජයකින් පස්සේ පක්ෂ නායකයෝ ඒවායින් ඉවත් වෙලා වෙන අයට ඒ අවස්ථාව ලබා දෙන, පවුල්වාදය හා පාදඩ සල්ලි පිළිකුල් කරන විදියේ පක්ෂ සම්ප්‍රදායක් රටට ඉතා අවශ්‍යයි. ■

# සීමා නිර්ණය ගැන විකල්ප යෝජනාවක්

**මයිල්වාහනම් තිලකරාජා**
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී (ජාතික කම්කරු සංගමය)



ලංකාවට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියන එක කාලයක් තිස්සේ කතා කරන මාතෘකාවක්. එකත් අරගලයක් තමයි. අද ඒ අරගලය තමයි පාරට ඇවිත් තියෙන්නේ. මීට කලින් ඒක කරපු අය ලිඛිතව දුන්නා මේ වගේ අදහස් තියනවා, මේවා කරන්න ඕන කියලා. විටින් විට පත් වුණ ආණ්ඩු ඒ සඳහා ඉදිරිපත් වුණා, මහජනතාවගේ අදහස් ගන්න පසුගිය යහපාලන රජය ඒ වෙනුවෙන්ම කමිටුවක් පත් කළා. ගමින් ගමට ගිහින් මහජනයාගෙන් ව්‍යවස්ථාව සම්බන්ධ යෝජනා ඉල්ලුවා. නමුත් ඒ වගේ අවස්ථාවකදී 'මම යෝජනාවක් දෙන්න ඕන' කියල හිතපු මහජනයාම තමයි තමන්ගේ කුස්සියට, දරුවාගේ පාසල් කටයුතු වගේ දේවල්වලට ප්‍රශ්න ආපු ගමන් 'සිස්ටම් ජේන්ජ්' එකක් ඕන කියලා කියන තැනට පත් වුණේ. එයත් ව්‍යවස්ථාව වෙනස් කිරීමේ අවස්ථාවක් තමයි.

ලංකාවේ ප්‍රශ්නයක් තිබෙනවා නීති නැත්නම් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සම්බන්ධයෙන්. එය යම් කිසි කණ්ඩායමකට කොටු වුණ කරුණක් බවට පත් වෙලා තිබුණා. නමුත් දැන් ඒක මහජනයාගේ පොදු

**අපේ පළමු ව්‍යවස්ථාව බිහි වෙන්නෙත් 1972 දී. ඒත් අපිටම කියල හදා ගත්තු එකකින් අවුරුදු 5ක් වත් පාලනය කර ගන්න බැරි වුණා. පළමු ව්‍යවස්ථාව හදන එකෙන්ම අපිට වැරදීමක් සිද්ද වෙලා තියෙනවා. එක හැදුවේ කවුද?**

මතයක් බවට පත් වෙලා තියෙනවා. මම දකින අරගලයේ හොඳම පැත්ත තමා මේක. දැන් සාමාන්‍ය ජනතාව වුණත්, ව්‍යවස්ථාවක් අවශයි, වෙනසක් අවශ්‍යයි, කියලා මේ පාලන ක්‍රමය ගැන ප්‍රශ්න කිරීමේ අවස්ථාවක් හැදිලා තියනවා.

## ව්‍යවස්ථා සම්පාදනයේ පූර්ව අත්දැකීම්

ඉතින් අපිට මේ සඳහා මොනවද කරන්න පුළුවන්..? නිදහස් ශ්‍රී ලංකාවේ අවුරුදු 74ක් ගැන කතා කරනවනේ. මගේ දිගින් දිගටම තිබුණු අදහසක් තමයි අවුරුදු 74න් භාගයක් වෙනකල්, ඒ කියන්නේ 1948 ඉඳල 1978 වෙනකල්ම අපිටම කියල ව්‍යවස්ථාවක් හදා ගත්තේ නැති රටක් නේ අපි. අපි අපිවම පාලනය කර ගන්නේ කොහොමද කියල හිතලා බලලත් නැහැ. අපි බ්‍රිතාන්‍ය රජය විසින් දීපු ඒවම අරන් ගියා, අපේ පළමු ව්‍යවස්ථාව බිහි වෙන්නෙත් 1972 දී. ඒත් අපිටම කියල හදා ගත්තු එකකින් අවුරුදු 5ක් වත් පාලනය කර ගන්න බැරි වුණා. පළමු ව්‍යවස්ථාව හදන එකෙන්ම අපිට වැරදීමක් සිද්ද වෙලා තියෙනවා. එක හැදුවේ කවුද? මහජනයාගේ යෝජනා අරන් අපේ ශ්‍රී ලාංකික අනන්‍යතාව රැක ගන්න පුළුවන් විදියට ඒක හැදුවද? එහෙම නැත්නම් දේශපාලන වැඩ පිළිවෙළක් අනුව හැදුවද කියලා ප්‍රශ්නයක් එනවා. ඊට පස්සේ 1978 දෙවැනි ව්‍යවස්ථාව කියල අපේම එකක් හදා ගත්තා, ඒකේ තියෙන ප්‍රශ්න තමා දැනුත් අත්විඳින්නේ. ඒකෙනුත් කළේ ලංකාවේ අනන්‍යතාවට ගැළපෙන ව්‍යවස්ථාවක් හැදීම වෙනුවට එක එක රටවලින් එහෙන් මෙහෙන් දාල හදා ගැනීමක්.

## පරිපාලන ක්‍රමයේ හා නියෝජන ක්‍රමයේ නොගැළපීම

මේ සියල්ල බලන විට අපේ රටේ තියන බොහෝ ප්‍රශ්නවලට හේතුව වෙලා තියෙන්නේ දේශපාලනය විතරක් නෙමේ. අපේ රටේ මූලික ප්‍රශ්නේ තියෙන්නේ පරිපාලනයත් එක්ක. අපි හිතන්න ඕන කොයි තරම් දුරට අපේ පරිපාලනයත්, ඡන්ද ක්‍රමයත්, දේශපාලනයත් එකිනෙකට ගැළපෙනවද කියලා. මේ නියෝජනයේ වැරදීමක් තියෙනවා. මහජනයාගේ නියෝජනය හරියට වෙන්නේ නැහැ. නියෝජනය පමණක් නෙමේ මහජනයාට අවශ්‍ය සේවයත් නිසි පරිදි සිදු වෙන්නෙ නැහැ අපි ඡන්ද ක්‍රමයකින් අපේ නියෝජිතයා පත් කරනවා. එයාගෙන් සේවය කොහොමද ලැබෙන්නේ? එයා අතින් අරගෙන දෙන්නේ නැහැනේ, එයා අරගෙන දෙන්නේ පරිපාලන ක්‍රමය තුළින්. අපිට පරිපාලන ක්‍රමයක් තියෙනවා. අමාත්‍යාංශ තියෙනවා, අමාත්‍යංශ ලේකම්වරු ඉන්නවා, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිලධාරි කියන ක්‍රමයක් තියනවා. අනිත් පැත්තෙන්, ඡන්ද ක්‍රමයෙන් පත්වෙන නියෝජිතයින් ඉන්නවා. මැතිවරණ කොට්ඨාස ක්‍රමය, දිස්ත්‍රික් ක්‍රමය එහෙම යනවා. නමුත් එකකට එකක් සමාන නැහැ. එක මන්ත්‍රී කෙනෙක් නියෝජන වෙන්නේ කොයිතරම් ජන සංඛ්‍යාවකින්ද එයා සේවය කරන්නේ කොපමණ ජනතාවකටද කියන ප්‍රශ්නය මතු වෙනවා. ඉලෙක්ටෝරල් සිස්ටම් එක නැත්නම් මැතිවරණ කොට්ඨාස කියන එක පොඩියි, එයා සේවය ලබා දෙන්න ඕන කියන පරිපාලන ඒකකය ලොකුයි. මේ දෙක අතර ලොකු පරස්පරයක්

**අපේ රටේ තියන බොහෝ ප්‍රශ්නවලට හේතුව වෙලා තියෙන්නේ දේශපාලනය විතරක් නෙමේ. අපේ රටේ මූලික ප්‍රශ්නේ තියෙන්නේ පරිපාලනයත් එක්ක. අපි හිතන්න ඕන කොයි තරම් දුරට අපේ පරිපාලනයත්, ඡන්ද ක්‍රමයත්, දේශපාලනයත් එකිනෙකට ගැළපෙනවද කියලා.**

තිබෙනවා, ඒ හින්දා ලංකාවේ සීමා නිර්ණය කියන එක නිවැරදිව හදාගන්න වෙනවා පළමුවෙන්ම.

## නිවැරදි සීමා නිර්ණයක් අවශ්‍යයි

උදාහරණ වශයෙන් මෙහෙම හිතමු, එක ග්‍රාම නිලධාරී වසමකට සිටිය යුතු ජන කොටස ගැන අපිට නිශ්චිත තීරණයක් තියෙනවද? එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් යටතේ කොයි තරම් ජනතාවක් නියෝජනය වෙන්න ඕනද කියල අදහසක් තියෙනවාද? ඊළඟට දිස්ත්‍රික්කයට. අනිත් පැත්තෙන් බලමු හරියට මහජනයා නියෝජනය වෙනවද කියලා පාර්ලිමේන්තුවේ? මේ ගැටලුවට මෙහෙම විකල්පයක් යෝජනා කරන්න පුළුවන්. පළමුව ග්‍රාම නිලධාරී වසමක් පිළිබඳ යම් සීමාවක් ඇති කර ගත යුතුයි. එවැනි වසම් තුනක් එකතු කිරීමෙන් එක කොට්ඨාසයක් හැදෙනවා. ඒ සඳහා ප්‍රාදේශීය සභාවට හෝ නගර සභාවට නියෝජිතයෙක් පත් වෙනවා. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයකට අයත් විය යුතු ජනගහනය ගැන යම් නිර්ණායකයක් හදාගෙන එවැනි බල ප්‍රදේශ දෙකක් එකතු කරලා පළාත් සභා කොට්ඨාසයක් අපට හදා ගන්න පුළුවන්. ඒ වගේම පළාත් සභා කොට්ඨාස හතරක් එකතු කරලා පාර්ලිමේන්තුවට එක නියෝජිතයෙක් පත් කරන්න පුළුවන්. මේ වගේ සීමා නිර්ණයකින් මහජන නියෝජනය වගේම පරිපාලනයත් විධිමත් කළ හැකියි.

දැන් තියන ක්‍රමය යටතේ පළාත් සභාවට තරග කරන කෙනාත්, පාර්ලිමේන්තුවට තරග කරන කෙනාත් නියෝජනය කරන සීමාව එකයි. දෙන්නම දිස්ත්‍රික්කයකින් තමා ඡන්ද ලබාගෙන එන්නේ. එතකොට මහජනයාගේ පැත්තෙන්, පළාත් සභා මන්ත්‍රී කෙනෙකුගෙන් බලාපොරොත්තු වෙන දේම තමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගෙනුත් බලාපොරොත්තු වෙන්නේ. පළාත් පාලන මන්ත්‍රී කෙනෙක් වුණත් එයත් පළාත් සභා මන්ත්‍රීගේ පාර්ලිමේන්තු මන්ත්‍රීගේ වැඩ ටික කරන්න ඕන කියන බලාපොරොත්තුව තියෙන්නේ. ඒ ඔක්කොම මහජන නියෝජිතයෝ, ඔක්කොම වැඩ කරන්න ඕන කියන එක. ඒ හින්දා තමයි පාර්ලිමේන්තු මන්ත්‍රී ගිහිල්ලා ගමේ පාර හදන්නේ. පළාත් සභා මන්ත්‍රී කෙනෙක් රට වටේ ලොකු දේශපාලනයක් කරන මන්ත්‍රී කෙනෙක් වෙන්නේ. සීමා නිර්ණයක් ඇතුව, මොකක්ද වැඩ කරන කොට්ඨාසය කියල පැහැදිලි කරගෙන නැහැ.

**දැන් තියන ක්‍රමය යටතේ පළාත් සභාවට තරග කරන කෙනාත්, පාර්ලිමේන්තුවට තරග කරන කෙනාත් නියෝජනය කරන සීමාව එකයි. දෙන්නම දිස්ත්‍රික්කයකින් තමයි ඡන්ද ලබාගෙන එන්නේ. එතකොට මහජනයාගේ පැත්තෙන්, පළාත් සභා මන්ත්‍රී කෙනෙකුගෙන් බලාපොරොත්තු වෙන දේම තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගෙනුත් බලාපොරොත්තු වෙන්නේ.**

ඒ නිසා මේ සියල්ල විධිමත් විය යුතුයි. 'සිස්ටම් චේන්ජ්' කියන්නේ ව්‍යවස්ථාව විතරක් නෙමෙ. පරිපාලන අංශයත් සම්පූර්ණ වෙනසකට ලක් කළ යුතුයි. ■

# පූර්ණ ප්‍රතිසංස්කරණයක් වහාම අවශ්‍යයි

**වීරසුමන වීරසිංහ**
පාර්ලිමේන්තු මන්ත්‍රී (ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)



1978 දෙවැනි ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැලැස්තර 20ක දාලා ඉවර කරලා 21 පැලැස්තරයක් දාන්නා හැදුවා, එය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ප්‍රතික්ෂේප වීමත් එක්ක 22 වැනි පැලැස්තරය දැන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා තියනවා. 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන වෙලාවෙම ජනතාව තුළ විශාල විරෝධයක් නැගුණා, ව්‍යවස්ථාව ගැන දන්නා, ව්‍යවස්ථාව ගැන අර්ථ නිරූපණය කරන්න පුළුවන් පක්ෂ හා කණ්ඩායම්වලින්, උගතුන්ගෙන් ඒ ව්‍යවස්ථාව විකෘති ව්‍යවස්ථාවක් කියන කාරණාව පැන නැගුණා. මේක ප්‍රංශ, ඇමෙරිකා, එංගලන්ත ව්‍යවස්ථාවල තියෙන ඇතැම් කොටස් එකතු කරලා හදපු ඒකාධිපති ව්‍යවස්ථාවක්. ඒ තුළ වෙච්ච දේවල් පහුගිය අවුරුදු හතළිස් හතරක් පුරා ඇස් පනා පිට දකිමින් තිබෙනවා. 1994 සහ 1994න් පස්සේ බලයට පත් වුණ හැම රජයක්ම ලබා දුන් පොරොන්දුවක් තමයි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කියන කාරණය. නමුත් මේ ගෙවුණු අවුරුදු විසි ගණන තුළ ඒ පොරොන්දුව ඉටු කරන්න බලයට පත් වුණ කිසිදු පාලකයෙක් සැබෑ ඕනෑකමක් දැක්වුවේ නැහැ. ඒ සඳහා

**මේක ප්‍රංශ, ඇමෙරිකා, එංගලන්ත ව්‍යවස්ථාවල තියෙන ඇතැම් කොටස් එකතු කරලා හදපු ඒකාධිපති ව්‍යවස්ථාවක්. ඒ තුළ වෙච්ච දේවල් පහුගිය අවුරුදු හතළිස් හතරක් පුරා ඇස් පනා පිට දකිමින් තිබෙනවා.**

අවශ්‍ය සහයෝගයක් අනෙක් දේශපාලන ධාරාවන්ගෙන් ලැබුණෙත් නැහැ.

වර්තමානයේ පවතින 9 වැනි පාර්ලිමේන්තුව අපේ රටේ දේශපාලන වශයෙන් විකෘතියක් වෙච්ච පාර්ලිමේන්තුවක්. මෙහි මහා ලොකු දේවල් බලාපොරාත්තු වෙන්නට ඉඩක් නැහැ. මේ විකෘතිය තුළ ජනතාවගේ විශාල පීඩනයක් පහුගිය මාස කීපය තුළ දකින්න ලැබුණා. මෑත ඉතිහාසයේ පළමු වතාවට රාජ්‍ය නායකයෙක් පලවා හරින මට්ටමටම ඒ මහජන විරෝධය උත්සන්න වුණා. ඉන් පසුව ඇති වුණ දේශපාලන තත්ත්වයන් තුළ, මේ විකෘති පාර්ලිමේන්තුවෙන් අප බලාපොරොත්තු වන ප්‍රකෘතිමත් ප්‍රතිසංස්කරණයක් ඒලෙසින්ම අපේක්ෂා කරන්න බැහැ. හැබැයි අපි විස්වාස කරනවා මේ මොහොත, මේ අර්බුදය යම් ප්‍රමාණයකට හේතු වේවි මේ රටේ, මේ තියන පරිසරය වෙනස් කරන්න, යම් ව්‍යවස්ථාමය වෙනසක් සඳහා මැදිහත් වෙන්න.

## 22 වන සංශෝධනය සාධනීය පියවරක්

ආණ්ඩුව විසින් අවසන් කැබිනට් මණ්ඩල රැස්වීමේදි අනුමත කරලා තිබෙනවා 22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. එය ගැසට් කිරීමෙන් පසුව පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් වේවි. ඒ තුළ යම් ප්‍රතිසංස්කරණයන් ප්‍රමාණයක් දක්නට ලැබෙනවා. මීට කලින් තිබුණු 19 සහ 20 ප්‍රතිසංස්කරණවල, විශේෂයෙන්ම 19 ගේන වෙලාවේ ජනතාවගේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා මහජන අයිතීන් පිළිබඳව. මේ සියලු ව්‍යස්ථා ප්‍රතිසංස්කරණ අතරින් ගත්තාම 19 යම් සාධනීය ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්. හැබැයි ඒ සමගම ඔවුන් එදා මැතිවරණ ක්‍රමය සම්බන්ධ පනත ගේන්න පොරොන්දු වුණා. නමුත් යහපාලන ආණ්ඩුව ඔවුන්ගේ කාලය තුළ එය ඉටු කළේ නැහැ. ඒ නිසා 20 වැනි සංශෝධනය විදියට පහුගිය රජය කාලේ ගේන්න සිදු වුණේ 19ට සංශෝධනයක් මිසක් අවශ්‍ය ප්‍රතිසංස්කරණ නෙමේ. ඒ වෙලාවේ අපිටත් අකැමැත්තෙන් හරි ඡන්දෙ දෙන්න සිදු වුණා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වසරක් තුළ ලබා දෙනවාය යන ගෝඨාභය ජනාධිපතිතුමාගේ පොරොන්දුව මත. නමුත් එය ඉටු කරන්න ඔහුට පුළුවන් කමක් ලැබුණේ නැහැ. ඒ නිසා මෙය විකෘතියක් බවට පත් වෙලා තියෙනවා. අලුතින් ආපු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය තුළ 19ට යෑමක් පේන්න තියෙනවා. ඒක සාධනීය ලක්ෂණයක්.

> **20 වැනි සංශෝධනය විදියට පහුගිය රජය කාලේ ගේන්න සිදු වුණේ 19ට සංශෝධනයක් මිසක් අවශ්‍ය ප්‍රතිසංස්කරණ නෙමේ. ඒ වෙලාවේ අපිටත් අකැමැත්තෙන් හරි ඡන්දෙ දෙන්න සිදු වුණා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වසරක් තුළ ලබා දෙනවාය යන ගෝඨාභය ජනාධිපතිතුමාගේ පොරොන්දුව මත.**

විශේෂයෙන්ම මේ ජන සමාජය තුළ ඒළියේ තියෙන අරගලයේ ප්‍රධාන කාරණා දෙකක් අපි දකිනවා. එකක් ආර්ථික පීඩාව තුළ පීඩාවට පත් වෙච්ච මිනිසුන්ගේ හඬ. ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් ඉල්ලන හඬත් ඒ තුළ නියෝජනය වෙනවා. ඒ නිසා ආර්ථික ප්‍රශ්නවලට උත්තර හොයනවා වගේම ප්‍රජාතන්ත්‍රික ප්‍රතිසංස්කරණ සම්බන්ධ ප්‍රශ්නයට උත්තර දීම මේ මොහොතේ කළ යුත්තක්. ඒහිදී සාධනීය පියවරක් තමා යෝජිත 22 වැනි ප්‍රතිසංස්කරණය. හැබැයි ඒ 22 වැනි ප්‍රතිසංස්කරණය විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියල තමයි අපි ශ්‍රී ලංකා කොමියුනිට්ස් පක්ෂය විදියට විශ්වාස කරන්නේ. මෙහි සාධනීය කාරණා බොහෝමයක් තිබෙනවා තමයි. පාර්ලිමේන්තුවට බලය පැවරීම,

පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම, මහජන ආයතනයක් විදියට ඒ තුළ ජනතාවට සහභාගී වෙන්න අවස්ථාවන් වැඩි වීම, සියලු දෙනාගේම මතයන්ට සවන් දීම ඇතුළු සාධනීය කාරණා ගණනාවක්ම තිබෙනවා.

## මැතිවරණ ක්‍රමයේ වෙනසක්

හැබැයි තේරී පත්වෙන පාර්ලිමේන්තු නියෝජිතයන් 225 සම්බන්ධයෙන් සමාජයේ අද තියෙන්නේ හොඳ චිත්‍රයක් නෙමෙයි. එය සාධාරණද අසාධාරණද කියලා විනිශ්චය කරන ඒක පැත්තකින් තියමු. හැබැයි තියෙන්නේ 225ම එපා කියන චිත්‍රය. ඊට හේතුව තමයි මේ පවතින මැතිවරණ ක්‍රමය තුළ සැබෑ නියෝජිතයන් පත්වීමක් සිදු වන්නේ නැති වීම. සැබෑ නියෝජිතයන් පත්වෙන්න තියෙන අවකාශයන් බොහොම අඩුයි. ඒ නිසා මේ අවකාශයන් මෙහෙමම තියාගෙන තවත් මැතිවරණයකට තව අවුරුද්දකින් හෝ හමාරකින් ගියොත් නැවතත් ඇති වන්නේ විකෘති තත්වයක්. ඒ නිසා අපේ ඉල්ලීම, මේ 22 වැනි සංශෝධනය වගේම මේ හා සමගාමීව ඊට ආසන්න විදියට අලුත් මැතිවරණ ක්‍රමයකුත් ලබා දිය යුතු බවයි. මේ ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් වෙනුවෙන් සටන් කරපු ජනතාවගේ හඬට යම් ප්‍රමාණයක හෝ සාධාරණයක් වෙන්න නම් එය අත්‍යවශ්‍යයි. ඒසේ නැතිනම් සිදුවන්නේ නැවත විකෘති ව්‍යවස්ථාදායකයක් නිර්මාණය වීමයි.

පහුගිය පාර්ලිමේන්තුවේදී අලුත් මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් වත්මන් අගමැති දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් දීර්ඝ සාකච්ඡා මාලාවක් පැවැත්වුවා. පක්ෂ හා කණ්ඩායම් ගණනාවක් ඊට අදහස් දැක්වුවා. හැබැයි එම වාර්තාව සත්‍ය වාර්තාවක්, යහපත් වාර්තාවක් විදියට එන්න තියෙන ඉඩකඩ අඩු වුණා. ඒ කමිටුව තුළ රැස් වෙච්ච පුද්ගලයන්ගේ පෞද්ගලික අභිමතාර්ථයන් සාධනය කර ගන්න යම් උත්සාහයක් ගත්ත බව පේන්න තිබුණා. කොහොම වුණත් යම් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි අවාසනාවට ඒ කමිටුවේ 17ක් නම් කර තිබුණත් ඒ වාර්තාවට අත්සන් තියලා තියෙන්නේ 8 දෙනෙක් විතරයි. ඒ 8 දෙනාම පැවතුණ ආණ්ඩුව නියෝජනය කළ පක්ෂ සහ ඔවුන්ගේ නියෝජිතයන්. අනෙකුත් පක්ෂවල කිසිම කෙනෙක් ඒ වාර්තාවට අත්සන් කරලා නැහැ. නමුත් ඒ වාර්තාව පදනම් කරගෙන හෝ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගැළපෙන ආකාරයට මැතිවරණ ක්‍රමයේ ප්‍රතිසංස්කරණයක් නොවුණොත් සිදු වන්නේ දැවැන්ත ඛේදවාචකයක්.

## සංශෝධනවලට යටත්ව සහාය දෙනවා

මේ 9 වැනි පාර්ලිමේන්තුව මේ රටේ දේශපාලන ඉතිහාසයේ වැඩියෙන්ම කතා බහට ලක් වෙච්ච පාර්ලිමේන්තුවක්. ඒ පාර්ලිමේන්තුව තුළ යම් සාධනීය කාරණාවක් හරි ඉටු කරන්න ඉඩ කඩ ලැබෙන්නේ මෙන්න මේ ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් නම් විතරයි. අපි ශ්‍රී ලංකා කොමියුනිට්ස් පක්ෂය විදියට 22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, සංශෝධනයන්වලට යටත්ව සහයෝජගය ලබා දෙන්න සූදානම් වෙලා ඉන්නවා. මොකද විජේදාස රාජපක්ෂ මැතිතුමා එදා ස්වාධීන කණ්ඩායමේ මන්ත්‍රීවරයෙක් විදියට මන්ත්‍රී යෝජනාවක් ලෙස ගෙන ආ ඒ කෙටුම්පත තමයි පෝෂණය වෙලා තියෙන්නේ. ඒ කෙටුම්පත හදන වෙලාවේ අපේ අදහස් මත තමයි ඔහු එය ඉදිරිපත් කළේ. ඔහු ව්‍යවස්ථා කටයුතු සම්බන්ධ අමාත්‍යවරයා විදියට එය දැන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක සාධනීය කාරණයක්. එය ශක්තිමත්ව ජයග්‍රහණය කරන්න සම්මත කරන්න අපේ දායකත්වය අපි ලබා දෙනවා. ඒත් ඒක්කම අපේ පක්ෂය විදියට අපි ප්‍රධාන වශයෙන්ම ඉල්ලා සිටින්නේ ජනතාවගේ මතය නියෝජනය වන පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවසස්ථාවක්. මේ පාර්ලිමේන්තුවට ඒ කටයුත්ත කරන්න පුළුවන් නම් මා විස්වාස

කරන්නේ එය තමයි ජනතාවට අපි කරන ලොකුම සාධාරණය. අපි ඒ වෙනුවෙනුත් ඉදිරිකාල සීමාව තුළ උපරිම මැදිහත්වීමක් කරනවා.

**අපේ පක්ෂය විදියට අපි ප්‍රධාන වශයෙන්ම ඉල්ලා සිටින්නේ ජනතාවගේ මතය නියෝජනය වන පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවසස්ථාවක්. මේ පාර්ලිමේන්තුවට ඒ කටයුත්ත කරන්න පුළුවන් නම් මා විස්වාස කරන්නේ එය තමයි ජනතාවට අපි කරන ලොකුම සාධාරණය. අපි ඒ වෙනුවෙනුත් ඉදිරි කාල සීමාව තුළ උපරිම මැදිහත්වීමක් කරනවා.**

## ව්‍යවස්ථාවක් සඳහා නව යෝජනා

සමස්ත අරගලය තුළ ජනතාවගේ ඉල්ලීමක් තිබුණා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට උගත් බුද්ධිමත් තරුණයන් දායක වන ක්‍රමයක් නිර්මාණය කරන්න ඕන කියලා. මේ පාර්ලිමේන්තුවේ එය ඉතා අවම වශයෙන් තමයි සිදු වුණේ. මිනිසුන්ගේ ඡන්දයෙන් උගත් බුද්ධිමත් පුද්ගලයන් පාර්ලිමේන්තුවට පත් වුණ බව ඇත්ත. නමුත් පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමයන් තුළ ඔවුන්ගේ ඍජු නියෝජනයක් සිදු නොවීම ගැන සමාජයයේ කතිකාවක් තිබුණා. 22 වැනි ව්‍යවස්ථාව 19 ව්‍යවස්ථාවට සමගාමීව යෑම තුළ, විශේෂයෙන්ම ආංශික කාරක සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට දායකවීමට ක්‍රමවේදයක් නිර්මාණය වෙනවා. ස්වාධීන පක්ෂ විදියට අපි යෝජනා කරපු දෙයක් තමයි, සෑම අමාත්‍යාංශයකටම වෙනම උපදේශක මණ්ඩලයක් පත්වෙන්න ඕන කියන කාරණාව. එම උපදේශන මණ්ඩලයේ නියෝජනය සම්බන්ධ කාරණාවේදී වෘත්තිකයන් සහ විෂය ප්‍රවීණයන් වගේම ජනසමාජයේ තරුණ නියෝජනයකුත් ලබා දිය යුතු බව. අපි විවෘතවම යෝජනා කළා අරගලයට දායක වුණ කණ්ඩායම්වලින් යම් නියෝජනයක් මේ මණ්ඩලයට ඇතුළත් විය යුතු බවට. තෝරා ගන්නා ක්‍රමවේදය සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡාවක් විය යුතුයි. නමුත් ඒ තරුණයන්ගේ හඬ නියෝජනය විය යුතුයි.

එම ප්‍රතිසංස්කරණ ඇතුළත් කරන්න ඕන කියලා අපි යෝජනා කරනවා. පාර්ලිමේන්තුව තුළ සිදු වන තීන්දු ගැනීමේ ක්‍රියාවලියට ජනතාවගේ සහ ජන සමාජයේ මතවාදයට ඉඩ කඩක් ලැබිය යුතුය කියන කාරණාව අපි යෝජනා කරනවා. විශේෂයෙන්ම ව්‍යවස්ථාදායක සභාවට සාමාජිකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡාවක් තිබුණා. එය පාර්ලිමේන්තුවෙන් වෙන්න ඕනද, පිටින් නියෝජිතයන් එන්න ඕනද කියන කාරණාව පහුගිය කාලේ සාකච්ඡා වුණා. ඒහිදී අපි යෝජනා කළේ පිටින් පත්වන නියෝජිතයන් ලෙස විද්වතුන්, වෘත්තිකයින් එවැනි සංවිධානවල නියෝජිතයින් ව්‍යවස්ථාදායක සභාවට පත් විය යුතු බවයි. එළියේ ජන සමාජයේ තිබෙන අදහස්වලට දොර විවෘත කිරීමක් මෙහිදී සිදු වේවි කියලා අපි විස්වාස කරනවා. එය පූර්ණ දෙයක් බවට පත්වන්න නම් සමස්ත ව්‍යවස්ථාවම වෙනස් විය යුතුයි.

## අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය


අලුතෙන් දේශපාලන පක්ෂයක් ලියාපදිංචි වීමට අදාළ ක්‍රමවේදයන් පවා වෙනස් වෙන්න ඕන. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙන්න නම් ජනසමාජයේ සහ ව්‍යවස්ථාදායකයේ ප්‍රජාතන්ත්‍රවාදය පමණක් නොවේ, පක්ෂ

අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පවා ශක්තිමත් විය යුතුයි. පක්ෂවල හැසිරීම පිළිබඳ මේ රටේ කවුරුවත් කතා කරන්නේ නැහැ. නමුත් පක්ෂ නායකයා පෞද්ගලික සමාග මක් විදියට ඇතැම් පක්ෂ මෙහෙයවනවා. ඒක තමයි අපි පහුගිය කාලේ දැක්කේ, අපේ රට මෙහෙයවූයේ පවුලේ කොම්පැනියක් මෙහෙයවන ආකාරයට. පක්ෂ මෙහෙයවන්නේ ඒ විදියට. ඒ නිසා  පක්ෂවල ප්‍රජාතන්ත්‍රවාදයත් අත්‍යවශ්‍ය වෙලාවක්. මේ නිසා මැතිවරණ කොමිසම පක්ෂ ලියාපදිංචි කිරීමේදී පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව මොකක්ද කියන කාරණය පරීක්ෂා කරනවා වගේම අදාළ ව්‍යවස්ථාවට අනුව ක්‍රියාත්මක වෙනවාදැයි සොයා බැලීමත් මැතිවරණ කොමිසමේ වගකීමක් බවට පත් විය යුතුයි. මා නියෝජනය කරන කොමියුනිට්ස් පක්ෂය අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන දේශපාලන පක්ෂයක්. අපේ ව්‍යවස්ථාව තුළ පහළම සාමාජිකයාගේ මතය පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා දක්වා යන ක්‍රමවේදයක් නිර්මාණය වෙමින් තිබෙනවා. ව්‍යවස්ථාපිත සම්මේලන ඔස්සේ තමයි පක්ෂයේ නායකයා සහ නායකත්ව මණ්ඩලය තේරෙන්නේ. අනෙක් පක්ෂවල මේ ක්‍රමවේදය තියනවද නැද්ද කියන කාරණය අපි කවුරුත් දන්නේ නැහැ. පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වන තාක් මේ රටේ ජන සමාජයට සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් සහ අයිතිවාසිකම් දිනා ගැනීමක් වෙන්නේ නැහැ.

මේ හැම කාරණාවක්ම සම්බන්ධයෙන් පුළුල් සාකච්ඡා සිදු නොවුණොත් අපේ රටට තවත් ඉස්සරහට යන්න බැහැ. තව අවුරුදු හතරකින් පහකින් කියාවි අවුරුදු 80වක සාපය කියලා, තව අවුරුදු 10කින් කියාවි අවුරුදු 90ක සාපය කියලා. මේක මෙහෙමම යනවා මිසක් ඉස්සරහට ගමනක් නැහැ. ඒම නිසා මේ සමස්ත ව්‍යවස්ථාපිත දේහයේම පූර්ණ ප්‍රතිසංස්කරණයක් වහාම ඇති විය යුතුයි. ■

# අපේ යෝජනාව
# සහසන්ධීය ව්‍යවස්ථාවක්

**සී. වී. විග්නේශ්වරන්**
පාර්ලිමේන්තු මන්ත්‍රී (තමිල් මක්කල් තේසිය කූට්ටනි)



ප්‍රජාතන්ත්‍රවාර්ගික පැහැය කුමක් වුවත්, දිවයිනේ ජීවත්වන ජනයා ක්‍රමයේ වෙනසක් ඉල්ලා සිටිති. එසේ වුවද, ඔවුන්ට වුවමනා වෙනස පිළිබඳ සම්මුතියක් නැත. නිදහස ලැබූ අවදියේ ගොඩනැගූ සහ ඉන් පසුව දිගටම පැවති දේශපාලන, සමාජ සහ ආර්ථික යටිතලය කාලකන්නි ලෙස අසාර්ථක වී ඇති බවට සැකයක් නැත. විශේෂයෙන්ම, මෙතෙක් ක්‍රියාත්මක කළ වාර්ගික කේන්ද්‍රීය ප්‍රතිපත්ති මෙතෙක් කල් පවත්වාගෙන ආ යටිතලය විනාශ කිරීමට දායක වී ඇත. රටේ සමෘද්ධියට සහ යහපැවැත්මට දායක විය හැකි වූ බොහෝ දෙනා කෝලාහල සහ සංහාර මගින් පලවා හරිනු ලැබූහ. කෙසේ වෙතත්, අද රට

**ලෝකය පුරා නූතන රාජ්‍යය ක්‍රියාත්මක වන්නේ නූතන ප්‍රගතිශීලී කළමනාකරණ හා පරිපාලන තාක්ෂණය සහ මූලධර්ම මතයි. සමස්ත ජාතියම, සියයට සියයක් සමජාතීය භාෂාමය, වාර්ගික සහ ආගමික කණ්ඩායමකින් සමන්විත නොවන්නේ නම්, සුළුතර කණ්ඩායම්වල අවශ්‍යතා ආරක්ෂා කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ වැදගත් අංගයක් බවට පත්වෙයි.**

බංකොලොත් තත්ත්වයට ඇද වැටෙද්දී ඔවුන්ට විදේශීය දේශගුණයන්හි හොඳින් ජීවත්වන්නට හැකි වී තිබේ.

ලෝකය පුරා නූතන රාජ්‍යය ක්‍රියාත්මක වන්නේ නූතන ප්‍රගතිශීලී කළමනාකරණ සහ පරිපාලන තාක්ෂණ සහ මූලධර්ම මතයි. සමස්ත ජාතියම, සියයට සියයක් සමජාතීය භාෂාමය, වාර්ගික සහ ආගමික කණ්ඩායමකින් සමන්විත නොවන්නේ නම්, සුළුතර කණ්ඩායම්වල අනන්‍යතා ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ වැදගත් අංගයක් බවට පත්වෙයි. සුළුතරයන් වර්ග දෙකකි. එක් කණ්ඩායමක් බහුතරය අතර සෑම තැනම විසිරී ජීවත්වන අතර ඔවුන් සලකනු ලබන්නේ අතිමහත් බහුතරය තුළ සුළුතරයන් වශයෙනි. තවත් කණ්ඩායමක් තමන් ජීවත්වන ප්‍රදේශයේ පැහැදිලි ලෙස බහුතරය වන නමුත් විවෘතව හෝ රහසිගතව හෝ වන බලහත්කාරය මගින් රටේ සෙසු ප්‍රදේශවල බහුතරය සමග බද්ධ වීමට නියම කරනු ලැබ ඇති අතර හිතුවක්කාර ලෙස සුළුතරයක් ලෙස හඳුන්වනු ලබයි. ඔවුන් තම වාසස්ථාන නිජබිමෙහි බහුතරය වන නමුත් සරල ගණිතමය ආකාරයෙන් සුළුතර බවට පත්කොට තිබේ. ශ්‍රී ලංකාවේ දෙමළ ජනයා අයත් වන්නේ දෙවැනි වර්ගයටය.

**බහුතර සිංහල ජනයා අද මුහුණ දී සිටින ප්‍රධාන ගැටලුවක් නම් දිවයින ගැන නිසි පරිදි සහ සත්‍ය වශයෙන් ලියන ලද ඉතිහාසයක් නොමැති වීමයි. එය දේශීය සහ ජාත්‍යන්තර ඉතිහාසඥයන්ගේ කණ්ඩායමක් විසින් ලියන ලද්දේ නම් ශ්‍රී ලංකික දෙමළ ජනයාට ඉතිහාසයේ හිමි වන ස්ථානය සිංහල ජනයාට තේරුම් ගත හැකි වනු ඇත.**

මෙම දිවයිනේ මුල්කාලීන පදිංචිකරුවන් වූ ඔවුන් ඉතිහාසයේ ආරම්භයේ සිට දිවයිනේ උතුරු නැගෙනහිර පළාත්වල පදිංචිව සිටින අතර අද වන විටත් එම පළාත්වල බහුතරය වෙයි. ඔවුන්ට ඔවුන්ගේම භාෂාවක්, සංස්කෘතියක්, ජීවන ක්‍රමයක් සහ ආගමක් ඇත. බහුතර සිංහල ජනයා අද මුහුණ දී සිටින ප්‍රධාන ගැටලුවක් නම් දිවයින ගැන නිසි පරිදි සහ සත්‍ය වශයෙන් ලියන ලද ඉතිහාසයක් නොමැති වීමයි. එය දේශීය සහ ජාත්‍යන්තර ඉතිහාසඥයන්ගේ කණ්ඩායමක් විසින් ලියන ලද්දේ නම් ශ්‍රී ලංකික දෙමළ ජනයාට ඉතිහාසයේ හිමි වන ස්ථානය සිංහල ජනයාට තේරුම් ගත හැකි වනු ඇත. ඉතිහාසයේ ආරම්භයේ සිට ඔවුන්ගේ පෞරාණිකත්වය අමතක කරමින්, මේ වන විට බොහෝ සිංහලයින් විශ්වාස කරන්නේ දෙමළ ජනයා ශත වර්ෂ දහයකට පෙර චෝල ආක්‍රමණය සමයේ මෙරටට පැමිණි මෑතකාලීන සංක්‍රමණික පිරිසක් බවයි.

මේ දක්වා ක්‍රියාත්මක කරන ලද ඒකීය ව්‍යවස්ථා මගින් සමස්ත රටේ බහුතරයට සැලකිය යුතු බලයක් ලබා දී තිබූ අතර මේ දක්වා උතුරු නැගෙනහිර පළාත්වල බහුතරය ලෙස වාසය කරන දෙමළ ජනයාගේ අයිතීන් රළු ලෙස යටපත් කිරීමට ඔවුන්ට අවස්ථාව ලබා දී තිබිණි.

සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 1වන වගන්තියේ සඳහන් පරිදි ස්වයං නීර්ණය සඳහා ජනතාවට ඇති අයිතිය අහිමි කිරීම මගින් මේ දක්වා සිදුව ඇත්තේ බහුතරය බව කියන සිංහල ජනයා විසින් දෙමළ ජනයා දෙවන මට්ටමේ පුරවැසි පිරිසක් බවට පත් කිරීමයි. ක්‍රමයේ වෙනසක් සඳහා දැරෙන ඕනෑම උත්සාහයකදී මෙම ප්‍රශ්නය බරපතළ ලෙස සැලකිල්ලට ගත යුතුය.

දෙමළ ජනයා වන අපි නිදහස් අරගලයේ පෙරමුණේම සිටියෙමු. බ්‍රිතාන්‍යයන් විසින් නිදහස ලබා දුන් විට අපි සිංහලයන්ගෙන් සාධාරණත්වය අපේක්ෂා කළෙමු. එසේ වුවද, බලයට පත් වූ විට සිංහල නායකයින් කළේ දෙමළ ජනයා ඉවත දමා දෙමළ ජනයා බහුතරය වූ ප්‍රදේශ ඇතුළුව දිවයිනම යටත් වන සේ බහුතරයේ ඒකාධිපතිත්වයක් පිහිටුවීමයි. මේ දක්වා දශ ලක්ෂයකට වැඩි දෙමළ ජනතාවක් දිවයිනෙන් එළවා දමා තිබේ. සමස්ත දිවයිනේ බහුතර ප්‍රජාවේ දේශපාලඥයින්ගේ එබඳු අදූරදර්ශී ප්‍රතිපත්ති නිසා අපට තිස් වසරක යුද්ධයකට මුහුණ දීමට සිදු විය. එබැවින් තිස් අවුරුදු යුද්ධයක් ඇති වීමට හේතු පවත්වාගෙන යෑම රටට ශාපයකි.

එම නිසා ක්‍රමයේ වෙනසක් ආරම්භ කිරීම සඳහා ව්‍යවස්ථා සම්පාදනයේ දැරෙන ඕනෑම උත්සාහයක දී උතුරු නැගෙනහිර ප්‍රදේශවල බහුතරය වන දෙමළ ජනයාගේ අභිලාෂයන් සැලකිල්ලට ගත යුතුය. මින් ඉදිරියට ඒකීය ව්‍යවස්ථාවක් පවත්වාගෙන යෑම රටට සියදිවි නසා ගැනීමක් විය හැකි නිසා අපගේ පක්ෂය යෝජනා කරන්නේ සහසන්ධීය (confederal) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින්, තම තමන්ගේ ප්‍රදේශවල බහුතරය වන ප්‍රජාවන් වහල්භාවයට සහ කොන් කිරීමට ලක් කළ හැකි අතර ඔවුන් සමස්ත රටේ බහුතරයේ ගැතිභාවයට පත් කළ හැකිය.

සහසන්ධීය (confederal) ව්‍යවස්ථාවක් සන්ධීය (fedaral) ව්‍යවස්ථාවකින් වෙනස් වන්නේ පහත සඳහන් ආකාරයෙනි. සහසන්ධීය ව්‍යවස්ථාවකදී පරමාධිපත්‍යය හිමි වන්නේ සාමාජික රාජ්‍යයන්ට නැතහොත් ඒකකවලටය. ඒ අනුව මධ්‍යම ආණ්ඩුව සාමාජික ඒකකයන්ට වගකිව යුතු වෙයි. සන්ධීය ක්‍රමයකදී මධ්‍යම ආණ්ඩුවට පරමාධිපත්‍යය හිමි වෙයි. සාමාජික ඒකක මධ්‍යම රජයට යටත් විය හැකි ය. එබැවින්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සහසන්ධීය ව්‍යවස්ථාවක් ලෙස සම්පාදනය කළ යුතු වන්නේ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර සාමාජික ඒකකයක් වන පරිදි සහ එයට ස්වයං නීර්ණ අයිතිය හිමි වන පරිදිය. ක්‍රමයේ වෙනසක් ඇති කිරීමට බලාපොරොත්තු වන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අත්‍යවශ්‍ය අංගයක් විය යුත්තේ ඒකීය ව්‍යවස්ථාවක සිට සහසන්ධීය ව්‍යවස්ථාවකට වෙනස් වීමයි.

**මින් ඉදිරියට ඒකීය ව්‍යවස්ථාවක් පවත්වාගෙන යෑම රටට සියදිවි නසා ගැනීමක් විය හැකි නිසා අපගේ පක්ෂය යෝජනා කරන්නේ සහසන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින්, තම තමන්ගේ ප්‍රදේශවල බහුතරය වන ප්‍රජාවන් වහල්භාවයට සහ කොන් කිරීමට ලක් කළ හැකි අතර ඔවුන් සමස්ත රටේ බහුතරයේ ගැතිභාවයට පත් කළ හැකිය.**

ජාත්‍යන්තර නීතියේ මූලධර්මවලට අනුකූල වූ දෙමළ ජනයාගේ ස්වයං නීර්ණ අයිතිය, මෙතෙක් කලක් ක්‍රියාත්මක කළ ඒකීය ව්‍යවස්ථාව තුළ මේ දක්වා පිළිබිඹු වුයේ නැත. වසර 70 කට වැඩි කලක් තිස්සේ ශ්‍රී ලංකික දෙමළ ජනයා ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණ කළහ. දෙමළ කතාකරන ජනයා උතුරු නැගෙනහිර පළාත්වල බහුතරය වුව ද, සිංහල බෞද්ධ ආධිපත්‍යධාරී මතවාදය, ප්‍රතිසංස්කරණ සඳහා නම්‍යශීලී ඉඩක් ලබාදුන්නේ නැත. එහි වෙනසක් ඇති කළ හැකි වන්නේ බලවතුන් අතර අවබෝධයක් ඇති කිරීමෙන් පමණකි. එම අවබෝධය ලැබිය හැක්කේ දැනුමෙන් මෙන්ම අත්දැකීම් තුළිනි. දැනුම ඇති නීතිය

පිළිබඳ මහාචාර්යවරුන් පවා මේ දක්වා කර ඇත්තේ ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ මතවාදයේ සිය දිවි නසා ගන්නා ප්‍රතිපත්ති අනුගමනය කිරීමයි. අත්දැකීම් මගින් සිංහල බෞද්ධයන්ට අවශ්‍ය පාඩම උගන්වන බව පෙනෙන්නට තිබේ. දේශපාලන බලය ලබාගැනීම සහ රටේ සම්පත් කොල්ලකෑම සඳහා දෙමළ සහ මුස්ලිම් ජනයාට එරෙහිව ඔවුන් පිළිවෙළින් ත්‍රස්තවාදීන් සහ අන්තවාදීන් ලෙස හඳුන්වමින් ගෙනගිය තර්ජනාත්මක ප්‍රකාශ දැන් ඔවුන් තේරුම් ගෙන ඇත. සුළුතර විරෝධී හැඟීම්වල රිද්මය දිගටම පවත්වාගෙන යන දේශපාලනඥයෝ, ඔවුන්ගේ වාසි සඳහා වුවමනාවෙන්ම නිර්මාණය කළ එබඳු උමතුවක ආවරණය යටතේ රට කොල්ලකෑමේ යෙදෙති.

අරගලය එබඳු දේශපාලඥයින්ගෙන් මිදීම සඳහා වූ ව්‍යාපාරයකි. එබඳු ක්‍රියාමාර්ගයක් තුළින් ජනතාවගේ අභිලාෂයන් සැබෑ ලෙස පිළිබිඹු වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමට කොතෙක් දුරට හැකි වේද යන්න ඉදිරියේ දී දැක ගත හැකි වනු ඇත. කෙසේ වෙතත්, තමන්ගේ අභිලාෂයන් පිළිබිඹු වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලබා ගැනීමට හැකි වීම සඳහා පීඩාවට පත් ජනයා ප්‍රතිසංස්කරණ සඳහා දිගටම උද්ඝෝෂණ කළ යුතු වෙයි. ■

## පසු සටහන

මෙම සංවාද මාලාව සඳහා, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ හා කණ්ඩායම්වල මන්ත්‍රීවරුන් සම්බන්ධ කර ගැනීම අපගේ අරමුණ විය. බහුතරයක් ඉතා උනන්දුවෙන් ඒ සඳහා සහභාගී වූ  නමුත් පාර්ශ්ව කිහිපයකින් පළ වූ ප්‍රතිචාරය කනගාටුදායකය. ආණ්ඩුවේ එක් පාර්ශ්වයක් නියෝජනය කරන ඩලස් අලහප්පෙරුම, මහාචාර්ය ජී. එල්. පීරිස් සහ මහාචාර්ය චරිත හේරත් යන තිදෙනාගෙන් එක් අයකුගේ අදහස් ලබා දීමට මුලින් එම පාර්ශ්වයේ එකඟතාව පළ වූ නමුත් දැඩි පරිශ්‍රමයකින් පසුවත් එම අවස්ථාව මඟහැරී ගියේය. එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී වජිර අබේවර්ධන සහ වතු කම්කරු සංගමය වෙනුවෙන් ජීවන් තොණ්ඩමාන් යන මන්ත්‍රීවරුන්ට අදහස් දැක්වීම සඳහා ආරාධනා කළද ඔවුන්ගෙන් ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබිණි. පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහගේ අදහස් දැක්වීම, ඔහුගේ පක්ෂයද ඇතුළත් පක්ෂ එකොළහේ අදහස් නියෝජනය වෙනුවෙනි. ■

VOICE OF CITIZENS

CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

www.facebook.com

www.twitter.com

www.youtube.com